"O, brother, I really cannot bear to send mother away to the hospital." My sister's eyes were full of tears

"Let's get a good doctor from the hospital to examine mother first. We can take a letter from our Doctor and see the senior physician of the hospital at his bungalow. He will examine her



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

more thoroughly when we pay him his fee. If he says we should leave her in the hospital, we will do that. Otherwise we will bring her home"

My sister and even my mother agreed to this suggestion. Mother's desire to live longer became clear to us from what she subsequently said and did Some women from the neighbourhood who visited us advised us however, not to take mother away from home.

"It is not good at this stage even to stir her from bed. She will be jolted about in the car," said the wife of the Shark.

"The Doctor says there is no danger in taking her," I retorted, "We must somehow take mother and show her to the hospital doctor The doctor that attends on her now does not like to treat her any more"

"Well, if he doesn't, why don't you take treatment from the *Vedarala?*"

"That is just what we have been doing these two months"

"If that is so, then fetch the senior doctor from the hospital and get her examined here."

The doctors of the hospital do not visit patients who live far away from the town," I said angrily, choosing the first retort that came to my mind.

I fetched a car and, taking both my mother and sister, went to see Doctor Chandra Heman, the chief physician of the hospital I did not allow the driver to go fast because I feared that mother would get worse if she was jolted about in the car. Every time the wheel bumped over a stone, and the car shook I was terrified. I had a presentiment that if the car jolted too much, mother would die on the way.

As soon as I had spoken to Doctor Heman, my fears began to subside. My sister and I began to speak about my mother's illness at the same time. As my sister spoke on without stopping, I fell silent. After she had finished, mother began to give an account of her woes. The doctor listened patiently, and took



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

mother to the next room. Getting her to stretch herself on the bed, he examined her. When he returned to the room after his examination, I looked at his face. I must have looked at him in the way a defendant in a law suit looks at the face of the judge about to give his verdict. The doctor could not have been insensitive to the anguish and distress that was reflected on my face. Yet he said nothing regarding the patient. Dropping into his pocket the fifteen rupees I gave him, without even counting it, he said,

"Bring your mother tomorrow to the Out-patients' Department of the hospital."

"Is my mother's condition very bad Sir?" I asked.

"It is a bad case," he said. "Bring her tomorrow. If we are to treat her, she will have to be left in the hospital."

The next day we rose early and took mother to the hospital. The first thing that mother saw as she entered the Out-patient's Department was a patient groaning in pain. On one of the wheeled stretchers, there was a man, with his smashed head looking like a bundle of jaggery. On another lay a man looking almost like a skeleton. As I looked at his anaemic eyes and at his face which had turned the colour of a ripened banana leaf, the very fear of death crept into my bones

A little way from the entrance at a table was seated a middle-aged man with a smiling face. His upper lip was covered by a moustache as bushy as a sqirrel's tail. Taking the printed form that he handed to me, I got it filled up by a clerk in the hall opposite. I then helped mother along slowly towards Doctor Heman's room.

I wanted to take mother away from the midst of these sick people who were groaning and gasping for breath. I felt she would be frightened. As we entered Dr. Heman's room, however, we came face to face with seven patients seated in a row, their faces torn with pain and agony. Next to his room there was a hall partitioned by white curtains into three rooms. From one of these there emanated a series of agonising, tortured groans. My mother looked round helplessly, her eyes staring out of her head.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"Don't be frightened, mother," I whispered.

My sister was standing by mother, her face immobile with grief, and her hand to her chin.

Receiving information that Dr Heman was examining a serious case in one of the rooms of the hall, I went and peeped inside A group of seven or eight medical students, men and women, with their stethescopes hanging from their necks, encircled the bed of the patient: the sight of whom struck me with the sudden fear that one experiences when encountering a ghost The patient lay on the bed, one of his legs bent at the knee and his head twisted to a side. He had a glassy look in his staring, wide-open eyes. I cannot say to this day whether the man I had seen was unconscious or dead.

The doctor was explaining to the students the name of the man's disease. I listened, but could understand only a few words of his discourse, so full was it of English words which I had never heard before. One of these words, "thrombosis", I repeated to myself, and referring up the dictionary when I had got home, I vaguely understood what the man's sickness was.

In the other room from which emanated the groans which I had heard earlier, there was the sudden clang of falling metal and a voice wailing, "A bad omen! O, my goodness! Heaven help me!" Thoroughly curious, I peeped in. On the bed was a man throwing his hands and feet and crying out in pain. The patient had cried out when a brass curtain rod fell on the ground, as an attendent drew the white curtains that shielded his bed from view.

As soon as Dr. Heman returned to his room I pressed forward and presented mother to him for examination. Another doctor who sat at a table not far from us was questioning his patient severely: "What's the trouble with you? What's the matter?" I heard the patient ramble on. The doctor prodded the patient's stomach with his finger; he pressed the man's side and scanned his face. Then, without a word, he began to write out a prescription. Handing the prescription over to the patient, he said briefly, "Three times a day. Come next week." Meanwhile Dr. Heman had handed us two forms which he had completed and had bade us take mother to the X-ray room.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I was directed by an attendant to a room which was situated on the ground-floor of a two-storeyed building: it is the first building one sees as one enters the front yard of the hospital. A doctor who sat in front of a frame enclosing what seemed to me like a milk-white glass sheet took the forms I handed to him. He glanced briefly through them and handed them to another doctor. The latter led my mother and sister into the Dark Room. I heard him request my sister to remove the necklace that mother was wearing and the safety-pins that she had fastened on her cloth and jacket. The doctor who sat by the electrically-lit glass sheet took what was, perhaps, a photo-sensitive plate, and hung it up against the glass. In an instant was clearly visible an image of the body of a woman from her chest down to the waist.

The doctor examined this image, which revealed even through the flesh and clothes the bones of a woman. Noting down something on a piece of paper, he took the sensitive plate off the stand and put it aside. He then placed another plate against the plate.

Mother and sister came out of the room. We then went again to Dr. Heman's room. We had sat there for about an hour when. Dr. Heman called me. "It would be a good thing for the patient to remain in the hospital. She is too old," he said.

I had believed that mother would definitely be cured this time, and I was at a loss to understand the doctor's words.

"Her illness is serious. It would be a good thing for her to remain in the hospital," Dr. Heman repeated. "Of course if you don't like to, you may take her away, " he added.

"If you so ask us, Doctor, we are willing to leave her here "

"I am not asking you to leave her here. How can I do that? It is your wish. If you don't like to leave the patient, you can take her away and try the Vedarala's treatment."

When I heard these words I realised that my mother's illness was even graver than what the doctor had made it out to be.

"We are quite willing to leave mother in the hospital," I said "But please, doctor, do take care of her."



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

" Of course, of course," said Dr. Heman as he disappeared into one of the other rooms to examine another patient. Now, through the gap between the curtain and the floor I could see only the shoes and lower part of Dr. Heman's trouser. The rest of him was screened off by the white curtain.

It was six o'clock in the evening when, leaving mother behind, we got home from the hospital. All along the way, my sister wept and her breast heaved with sighs.

" O, brother, I cannot bear it. How can we go back home, leaving mother all alone in the hospital ! " These were my sister's first words to me.

" What else could we have done? We have tried Sinhalese medicine. We have consulted the doctors. As there was no improvement the only thing we could do was to leave her in the hospital. It is there that she will recover, if she does at all."

" I have a fear that mother will never come home again. If only, with the help of gods, mother is cured just this once ! " My sister said this and burst into tears. " Alas, brother," she continued, " it is true what mother said, that she cried out for water one night. In my sleepness I thought that mother was asking for water just to annoy us. Oh, dear, Perhaps mother's condition got worse because I didn't give her water that night ! "

" No, that couldn't be," I said, going straight into my room. I fell upon my bed and closed my eyes. The continuous strain of the last two months and the anxiety of the last two days had made me so weary in body and mind that I fell asleep immediately.

Next morning I went to the hospital to inquire after mother's health. I returned homewards not displeased when I learned that mother's condition was neither better nor worse. In fact, I was somewhat glad. On the morning of the next day, however, an attendant who worked in the hospital came home and informed me that mother had died in the early hours of the morning. The attendant lived in a house about half a mile from ours.

" You have come so early in the morning to tell me that ! " I burst out. It was a feeling of anger rather than of grief that first sprang in my mind. The attendant went back, muttering something.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

" How are we to know that you had left your mother in the hospital in order to be rid of her ? "

The words came to me faintly. I was so blind with rage that I could have smashed his head.

I had been washing my face. I threw over the stool and the basin I was using. I lifted up the water-pot that was lying near by and dashed it to bits against the over-turned stool. Soon anger began to give way to grief. Crying out aloud, I went to the drawing room and fell on a chair. My sister ran up to me and stroked my head as I wept.

" Dont cry, dear brother. It was mother's *karma.* What can we do ? "

*(Translated with the author's permission by Visvakarma.)*



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"There is no general doctrine which is not capable of eating out our morality if unchecked by the deep-seated habit of direct fellow-feeling with individual fellow-men."

GEORGE ELIOT

* * *

"We can love with our minds, but can we love only with our minds? Love extends itself all the time, so that we can even love with our senseless nails; we love even with our clothes, so that a sleeve can feel a sleeve."

GRAHAM GREENE.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# කබුකි

දහසය වන සියවසෙහිදී ජපානයේ ඉද්සුමෝ දේශයෙන් නාට්‍යකලාවට නව ආලෝක ධාරාවක් වැටිණ. මෙහි ප්‍රතිඵලය පෙර අපර දෙදිග නාට්‍ය කලාවන්හි ස්වරූපය කෙරෙහි බලපෑනු අද දක්වා දැකිය හැකිය. මේ ආලෝක ධාරාව අනෙකක් නොව, 'ඔකුනි' නම් නිළියගේ ප්‍රතිභා මහිමය මූර්තිමත් කොට දක්වන 'කබුකි' නාට්‍ය කලාවයි. නාට්‍ය කලාවක් ලෙස සකස්කරගන්ට පෙර, 'කබුකි' යනුවෙන් හැඳින්වුණේ, ආවීර්ණ කල්පිත ජපනා විසින් යාඥා සඳහා යෙදුණ, 'නෙම්බුත්සු ඔදෙරි' නමින්වූ නැටුම් විශේෂයකි.

“නාට්‍ය හා ගීත කලාවන් පාදක කොට ගත් නැටුම් ක්‍රමයත්,” යන අරුත 'කබුකි' යන වචනයෙන් ලැබේ. අපරදිග ඇසින් බලනවිට කබුකිය, නාට්‍යයකට වඩා විවිධ ප්‍රසංගයකට කිට්ටු බව පෙනේ. එහෙත් මෙහිදී එක් කරුණක් සිත තබාගත යුතුය. කබුකිය බටහිර නාට්‍ය විචාර ක්‍රමයන්ගෙන් මිණිය හැක්කක් නොවේ. එසේ බටහිර මිම්මෙන් මණින්ට ගිය බොහෝ දෙනෙක් නොමග ගියහ. මෙය ජපානයටම ආවේණිකවූ, සංකීර්ණ නාට්‍ය ක්‍රමයකි.

කබුකියේ එකවරටම කැපී පෙනෙන අංගයක් ඇත. එනම් එහි කථා වස්තුව ජපානයේ සම්භාවනීය කථාන්තරයන්ගෙන් ඇද ගැනීමය. මේ කරුණු වලින් එක් ලක්ෂණයක් පැහැදිලි කරයි. එනම් කබුකිය පොදු ජනයා අතරින් මතුවූ පොදු ජනයාගේ කලාත්මක රස වින්දනය, තෘප්තිමත් කිරීමට සැකසුණ කලාවක් මිස බුද්ධිමතුන් සැනසීමට වූවක් නොවන බවයි. මේ නාට්‍යයන්ට අද්භූත දෙයම ඇතුළු කිරීමෙන් එය පැහැදිලිය. මේ නාට්‍යයක් බලා රසවිඳින්නට යම් බුද්ධිමතකු සිතන්නේ නම්, ඊට පළමුව තමන්ගේ දැකුම්කෝණය සම්පූර්ණයෙන්ම වෙනස් කර ගතයුතුය. සාමාන්‍ය දැනුම, විඥානත්මක විග්‍රහය, තර්කානුකූල චින්තනය හා බුද්ධි ගවේෂණය මෙහිදී මොහොතකට බැහැර කළ යුතුය. “බුද්ධියට ගෝචර වන දෑය මෙහි සෙවීම, රුක්මුදුනකට නැග මසුන් සෙවීම”ට නො දෙවෙනි යැයි ජපන් විචාරකයෝ පවසති. එසේ නම් මෙය තේරුමක් නැති විගඩම්වලින් පිරුණු එකක් ද ? ඔව්, සමහර නවීන විචාරකයින්ට එසේ පෙනෙන්ට ඉඩ තිබීම එතරම් පුදුමයක් නොවේ. එහෙත් මෙහි යම් අර්ථ ශූන්‍ය ගතියක් පෙනෙන්ට තිබේ නම, එයම කබුකියේ කැපී පෙනෙන අංගයක්වේ. ඉදුරන් හා හැඟීම් පිනවීමට මුලසිටම සකස්කළ ක්‍රමයකි මෙය,



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රධාන වශයෙන් ඇසට හා කණට ප්‍රිය දෙය ඉදිරිපත් කිරීම කබුකියේ විශේෂ ලක්ෂණයකි.

මෙහි කථාවස්තුවට ලැබෙන්නේ ප්‍රධාන තැන නොවේ. කලාත්මක ප්‍රකාශන ඉස්මතු වේ. රඟන නළුවන් හා ඇසෙන ගීතය කෙරෙහි අවධාරණය යෙදීම කබුකියේ නියම රසය විඳීමට උදව් වේ. ඒ සමගම තමා පිවිසෙන්නේ සුරංගනා ලොවකට යැයි මොහොතකට සිතාගෙන කබුකි නාට්‍ය ශාලාවකට ඇතුළු විය යුතුය. නැත්නම් සමහරවිට නාට්‍යය නිකම් විගඩමක් මෙන් හිතෙන්ට පිළිවන.

ලොව අන්‍ය නාට්‍ය කලාවන්ට වඩා වෙනස් ලක්ෂණ කබුකියෙහි ඇතිවීම, එහි විශේෂත්වයට දෙස් දෙන්නකි. මුලදී නිළියන් ප්‍රධානතැන ගත් කබුකිය පසුකාලයේදී නළුවන්ටම වෙන් විය. නෘත්‍ය හා ගීතයට මුල් තැන දුන් "නෝ" නාට්‍යයෙහි ලක්ෂණද පසුව මෙයට සංකලනය වන්ට විය. කබුකිය පිරිමි නළුවන්ටම වෙන්වූ පසු, ගැහැණු චරිතද පිරිමින්ටම රඟ දැක්වීමට සිදුවිය. ඒ සඳහා නළුවන් කුඩා අවදියේ පටන්ම පුහුණු කරති. ගැහැණුන් අතර හදා වඩා, ගැහැණියක්ලෙස හැසිරීමට මේ නළුවන් හැඩ ගස්වති. මේ නළුවෝ ගැහැණුන්ට වඩා අගේට ගැහැණු චරිත රඟපාන්නේ මේ පරම්පරාගත පුහුණුව නිසාය ගැහැණු චරිත රඟන මේ නළුවන්ට "ඔන්නගතා" නැතහොත් "ඔයාමා" යැයි යෙති. "ඔහිමෙස්සා" නොහොත් "ඔයිරාන්" නම් වෛශ්‍යා චරිතය රඟපෑම "ඔන්නගතා"ට අයත්ය ක්‍රි ව: 17–19 සියවස්හි, වෛශ්‍යාව කලාත්මක රසවින්දනය මූර්තිමත් කරන සංකේතයක් ලෙස ජපනා විසින් පිළිගැණින. සාමාන්‍යයෙන් දැකිය නොහැකි නාරී සුරූපීත්වයක් "ඔන්නගතා" විසින් දක්වයි. "ගෙයිෂා" නම් වෛශ්‍යා චරිතය විදහා දැක්වීම ද "ඔන්නගතා" ට ම අයත්ය. මෙයින් වෛශ්‍යාවගේ සුරූපී බව පෙන්වයි.

ලොව අන්‍ය නාට්‍ය ක්‍රමයන්ට වඩා වෙනස් විශෙෂ ලක්ෂණ, කබුකියේ සෑම අංශයකින්ම අපූරුවට දැකිය හැක්කකි. කරළිය සකස් කිරීම කබුකියටම විශේෂවූ ක්‍රමයකින් ගෙන යති. කබුකි පෙන්වන නාට්‍ය ශාලාවන්හි නවීන නාට්‍යයද පෙන්වති එහෙයින් යුරෝපීය 'තිරය', කරළියට යෙදීම මෑතවැසි පිළිගෙන ඇත. එහෙත් පිළිවත් සෑම තැනකදීම ඉහලට අකුළන, යුරෝපීය තිරවර්ගය බැහැර කරති. සරල රටාවකින් යුරු 'මකු' නම් කපු රෙද්දෙන් කළ තිරයක් යොදති. මෙය දෙපසට විවර කරන තිරයකි. තෝකියෝ නාට්‍ය ශාලාවල යොදන 'මකු' තිරය කොළ,



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රඟ හා කළු තීරුවලින් යුක්තය. කන්සායිහි නාට්‍ය ශාලාවන්හි මේ තිරය නොයෙක් පාටවලින් යුතුය. කබුකි කරළියේ, සරල රටාවෙන් යුත් මේ තිරය "ජෝෂිකි-මකු" (නියම තිරය) නමින් හැඳින්වේ. කබුකියෙහි නියම සාරයට, මේ තිරයද අගේට ගැලපෙන බැව් විචාරකයෝ පවසති.

කබුකි කරළියට වම් පසින් පිවිසීමට තනා ඇති "හනාමිචි" නම් පථය පියකරු අංගයකි. "පුෂ්ප මාර්ගය" යනු හනාමිචි යන වචනයට දිය හැකි අරුතයි. හනාමිචියෙන් කරළියට නළුවන් පැමිණීම "දේ" යනුවෙන් හැඳින්වේ. කරළියේ සිට, "අගේමකු" නම් කුඩා තිරයකින් වැසුණු පිටවන දොරටුවට යන නාට්‍යාකාර ගමනට "හික්කොමි" යැයි ද යෙති. මේ ක්‍රමයෙන් නාට්‍යයෙහි දර්ශනාත්මක භාවය දෙගුණ කරයි නළුවන් හා ප්‍රේක්ෂකයන් අතර සම්බන්ධයද මෙයින් ලැබීමෙන්, ප්‍රේක්ෂකයන්ගේ පරමාර්ථය මුදුන් පත්වේ. මෙවැනි ලක්ෂණයක් ලොව අන් කිසිදු නාට්‍යයක දැකිය හැකි නොවේ.

"මවරිබුතයි" නම් කැරකෙන කරළිය, බටහිර මෙන්ම නැගෙනහිර උසස් නාට්‍ය විචාරකයින්ගේ නළල් තලයන් රැළි ගැන්වීමට පොහොසත්වී ඇත. කරළියට එන ජවනිකා වහ වහා වෙනස් කිරීමට යොදා ගත් සියුම් විධියකි, "මවරිබුතයි" එක් ජවනිකාවක් ගොස් තවත් ජවනිකාවක් ඒමට යන අතරතුර කාලය පටු කිරීමට යොදාගත් මේ ක්‍රමය ජපනාගේ බුද්ධි මහිමයට දෙස් දේ. "සෙරියගේ" නම් අංගය මීළඟ සියුම් ක්‍රමයයි කරළියට යටින්, කරළිය මතුපිටට නළුවන් එසවීමයි මින් කෙරෙන්නේ. නළුවා කරළිය මතුපිටින් යටට කිඳා බැස්වීමේ ක්‍රමයක්ද ඇත. එය "සෙරිසගේ" නමින් බැවහැරය.

"කි" නොහොත් "හ්යෝෂිගි"; නම් තිරය ඇරීමට සහ වැසීමට යොදන සිවුරැස් ලී පතුරු දෙක කබුකියටම වෙන්වූ අංගයකි. "හ්යෝ ජෙන්කතා" නම් සහායකයෙක් මේ ලීපතුරු ක්‍රියාවේ යෙදවීමට කරළිය පාලකයාට උදව් වේ. නාට්‍ය පටන් ගැන්ම, විවේක කාලය හා අවසානය හැඟවීමට මේ පතුරු දෙක එකට ගටා තියුණු ශබ්දයක් නංවයි එපමණක් නොව මේ ලී පතුරු දෙකින් තවත් ප්‍රධාන කරුණක් සිදු කරයි. කබුකි නර්තනයක එක් උත්කර්ෂවත් අවස්ථාවක් දැක්වීමට නළුවා, ගෝලාකාරව ඇස් ඇරගෙන, සෙල් පිළිමයක් මෙන් එක ඉරියව්වක ඉඳී. මේ ඉරියව්වට "මි" යැයි යෙති. මේ උත්කර්ෂවත් අවස්ථාවට ප්‍රේක්ෂකයින්ගේ අවධාරණය යොමු කිරීමට, "හ්යෝෂිගි" නම් පෙරකී



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පතුරු දෙසා එකට ගවා තියුණු ශබ්දයක් නංවති. සමහරවිට මේ අවස්ථාව වනවිට ප්‍රේක්ෂකයින්ගේ අවධාරණය විසිරී තිබෙන්ට පිළිවන එහෙයින් ප්‍රේක්ෂකයින් ඒ දෙසට යොමුකිරීමට මෙයින් ලැබෙන වහල සුළුපටු නොවේ.

"වෝබෝ" නම් සංගීතය කබුකියේ ආත්මය වේ. මේ සංගීතය කබුකියෙන් රසය උරා දෙන්නකි. "දෙබයෂි" යනුවෙන් දන්නා වාද්‍ය කණ්ඩායම මේ සංගීතය ඉදිරිපත් කරති. නාට්‍යයෙහි මතුවන නොයෙක් ශබ්ද අනුකරණය කිරීමට "ගේසා" නම් සංගීත මංජුෂාව උදව්කැර ගනිති. තවත් එක් ලක්ෂණයක් මෙහිදී පෙන්වා දිය හැක. "කුරෝගෝ" නොහොත් "කුරෝම්බෝ" සහ "කෝකෙන්" යනුවෙන්; නළු නිළියන්ට කරළියේදීවන අනපසුවීම් පෙන්වා ඊට උදව් කිරීමට) සහායකයෝ දෙදෙනෙක් මෙම නාට්‍ය යෙහි සිටිති. "ප්‍රොම්ටර්" නමින් බටහිර සමහර නාට්‍යවලද මේ කාර්ය ඉටුකළ සහායකයෙක් විය. ලංකාවේ 'සොකරි' වැනි ගැමි නාට්‍යවලද මෙවැනි සහායකයන් සමහරවිට නළුනිළියන්ට සහායවනු දැකිය හැක.

ජපානයේ ප්‍රධාන ලෙස ගැනෙන කබුකි නාට්‍යයන් ගැන යමක් කිව යුතුය. ඉතා උසස් ලෙස ගැනෙන කබුකි නාට්‍ය දහ අටකි. මේ නාට්‍ය දහ අටට "කබුකි ජුහ චිබන්" යනු පොදු නාමයක් වශයෙන් බැවනැර කරති. "ඉචිකාවා" නම් නාට්‍ය පරම්පරාවට අයත් පරම ධනය මේ "කබුකි ජුහ චිබන්" වේ. දැනුදු මේ නාට්‍ය කරළියට නැගීමට හෝ පොත් වශයෙන් මුද්‍රණය කිරීමට හෝ බලය ඇත්තේ "ඉචිකාවා" පරම්පරාවෙන් එන අයටය. මේ දහ අටෙනුත් ඉතා උසස් නිපදවීම් ලෙස පහත සඳහන් හත පරසිදුය. "සුකේරොකු" (සුකේරොකුගේ ප්‍රේමය), "කන්ජින් චෝ" (යහපත් සේවකයා), "ෂිබරකු" (විනාඩියක් නවතිනු !), "යනොනෙ" (ඊතල තුඩ), "කෙනුකි" කෙස්අඬු), "නරුකමි" (ගර්ජනය), සහ "කමහිගෙ" (ලොකු දැකැත්තකින් කැපීම) යනුයි. මේ හතෙන් 'සුකේරොකු" හා "කන්ජින් චෝ" යන නාට්‍ය දෙක උසස් බවේ මුදුන් පෙත්තටම නගී. "කබුකිජුහචිබන්" නාට්‍ය දහඅටට විශේෂවූ ලක්ෂණය නම් වීරාභිවාදනයයි. වීරාභිවාදනය නැතිව 'කබුකි ජුහචිබන්" යැයි නාට්‍ය විශේෂයක් තිබිය නොහැකියයි ජපන් විචාරකයෝ එක් මතින් පිළිගනිති 'කබුකි ජුහචිබන්" යන්නට "අරගතෝ" හෙවත් පුරුෂ චරිතයන්ගෙන් යුත් නාට්‍ය යැයි ද ව්‍යවහාර වේ.

ඓතිහාසික සිද්ධීන් මුල්කොට සැකසුණ කබුකි නාට්‍යයන් ද ඇත. මේ නාට්‍යයන්ට "ජි දයි මොනො" යැයි ව්‍යවහාර වේ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

“සුගවරා දෙන්ජු තෙනෙරසික ගමි”, “කන දෙහොන් චුෂින්ගුර,” සහ “ෂින් උසුසුකි මොනොගතරි” මේ වර්ගයේ නාට්‍යයන්ය. “ජිදයි මොනො” යනු මහා කබුකි නාට්‍යයක එක් අංකයක් පමණි. මේ ඓතිහාසික නාට්‍යයන්හි රසය උද්දීප්තිමත් කිරීමට “චෝබෝ” සංගීතය කෙතරම් සහාය වන්නේද යනු සිතිය නොහැකි තරම්ය.

කබුකි නාට්‍ය අද්භූත දෙයින්ම පිරුණත් ජපානයේ එදිනෙද ජීවිතය ගැන යම් අවබෝධයක් ඉන් ලැබිය නොහැක්කේ නොවේ. ‘ආලය’ වැනි එදිනෙද ජීවිතයේ සිදුවීම් මේවායෙහි සුලභය. “ෂින්ජු තෙන් නො අමජිම” (අමජිමහි සියදිවි හාණිකිරීම් දෙකක්) සහ “මෙයිදො නෝහික්යකු” (පරලොවට පලායාමට ගත් තැන) යන නාට්‍ය මින් සමහරකි. මේ වර්ගයේ නාට්‍යයන්ට “සෙවමානෝ” යනු පොදු නමකි. පසු කාලයකදී ජපන් රටේ “කිසවමානෝ” නමින් පහළවූයේත් මෙවැනිම නාට්‍ය විශේෂයකි.

රඟ දැක්වීමේදී කබුකියටම විශේෂවූ නාට්‍ය ක්‍රම දැකිය හැක. අංගචලනයෙන් පමණක් යම් ක්‍රියාවක් දැක්වීම් වශයෙන් හෝ අදහස් හැඟවීම් වශයෙන් යොදාගත් මුද්‍රා නාට්‍ය ක්‍රමයක් මෙහි ඇත. මෙයට “දම්මරි” යනු නාට්‍ය භාෂාවෙන් නම් කැරිණ. එදා දඹදිව සංස්කෘත නාට්‍ය යෙහිද අභිනය දැක්වීමෙන් පමණක් අදහස් දැක්වීම ප්‍රචලිතව පැවැතිණ. මේ සමානකම්වලින් පැවසෙන්නේ කුමක් ද ? යනු හෙළිකිරීම අනාගත ගවේෂකයන්ට භාරය.

“සෙවමානෝ” වර්ගයේ නාට්‍යයන්හි “මිනීමැරුම්” දක්වන ජවනිකා ද ඇත. මෙය ඉතා කෲර දර්ශනයකි. එහෙත් ඒ සමග ගායනය කරන ගීත වාදනය නිසා “කොරෙෂි” නම් ඒ මිනී මැරුම් දර්ශන දැකීමෙන් ප්‍රේක්ෂකයින් තුළ කම්පා වීමක් ඇති නොවේ. ඒ වෙනුවට කලාත්මක රසයක් ඉන් විඳගැනීමට උදව්වේ. “කෂි කොරෙෂි” නම් නාට්‍යයෙහි එන ගං ඉවුරේ මිනීමැරුම් දර්ශන ඉතාමත් කලාත්මකව විදහා දක්වා ඇත.

“මිචියුකි” නමැති රසවත් නාට්‍ය අංගයක්ද මෙහි පෙනේ. පෙම්වතකු පෙම්වතියක ඇද වැළඳගන්නා සැටි කරළියට නැගී මෙන් ප්‍රේක්ෂකයින්ගේ සිත් කුළුමත් කිරීමෙහි උපයෝගී වේ. ඉතා දිග නාට්‍යයක් බැලීමෙන් උදාසීනත්වයට පැමිණෙන ප්‍රේක්ෂකයා උනන්දු කිරීමට මෙය ඉතාමත් ප්‍රයෝජනවත්ය.

මේ නාට්‍යයන්හිදී ඉතා ප්‍රධාන දෙයක් කීමේදී “මොනොගතරි” නම් කථාන්තරකීමේ ක්‍රමය යොදාගනිති ඒ නාට්‍යයේ උත්කෘෂ්ටවත් අවස්ථාවකදීය. නාට්‍ය හා චෝ බෝ සංගීතය සමග එකට යන



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ "මොනොගතරි" ය නිසා කබුකිය රස ගුලාවක් වේ. "මොනොගතරියේ" කොටස පවරා දෙන්නේ දක්ෂම නළුවෙකුටය. එය එතරම්ම දුෂ්කර අවස්ථාවක් හෙයිනි. එකී නළුවාගේ සහජ දස්කම් පෑමට මෙතැනට වැඩි අන්තැනක් කබුකියේ නැති තරම්ය. "ඉචිනොතනි පුතබගුන්කි" (ඉචිනොතනි යුද්ධයේ විස්තර) නම් නාට්‍යය මීට හොඳ සාක්ෂියකි.

'තැබි ජික් කෙන්" හෙවත් 'මළමිණියක හිස පරීක්ෂා කිරීම' කබුකියටම වෙන්වූ නාට්‍යාංගයකි. මෙය ලෝකයේ අන් කිසිම නාට්‍යයක දැකිය හැක්කක් නොවේ. ආවිර්ණකල්පිත යුගයේ ලක්ෂණ මේ අංගයෙහි ඇත්තේද ? යනු විතර්කයෙකි ජපානයේ රදළ පාලනයේ විෂම අංගයක්ද මින් විදහා දක්වයි. ජපන් සංස්කෘතිය ගැන හදාරන්නෙකුට මින් ලැබිය හැකි පිටුබලය විශාලය. "තෙර කොයා", පෞද්ගලික පාඨශාලාව) නම් නාට්‍යයෙහි මේ අංගය හොඳහැටි රඟදක්වා ඇත.

බටහිර විචාරකයෝ සමහරවිට, කබුකියේ විවිධ ප්‍රසංග ලක්ෂණ ඇතැයි කියති. එය පැහැදිලි වන්නේ 'බෙන්තෙන් කොසො" (ජපානයේ රොබින් හුඩ්), "යොෂිත්සුනෙ සෙම්බොන් සකුර" (යොෂිනො පර්වතයන්හි යොෂිත් සුනෙ) යන නාට්‍ය රඟදක්වන පරීක්ෂාකාරීව බැලුවොත් පමණි.

"සවරි" සහ "ත්සුරනෙ" යන අනුපමේය නාට්‍ය විධිවලින් පුදුම ආස්වාදයක් ඓතිහාසික කබුකි නාට්‍ය තුළින් උරා දෙයි. සෙසු නළුවන්ට නොඇසෙනසේ එක නළුවකු තනිව පවසන වචනයන්ට "සවරි" නම යෙදේ. ඉංග්‍රිසි නාට්‍යයේ "එසයිඩ්" යන අංගය මීට සමානය, එහෙත් තරමක් වෙනස්ය. මෙසේ කථා කරන්නේ ගැහැණු චරිත පමණි කබුකියේ. සරළ බසින් කරගෙන යන දෙබසකදී හදිසියේම ඉතා බර, ගැඹුරු වචනින් කථාකරන්ට පටන් ගැනීම "ත්සුරනේ" නම්. "යකුහරයි" යනු ද මෙයමය. මේ ක්‍රමය ගැන හොඳ අවබෝධයක් ලැබීමට "ෂිබරකු" (මිනිස්තුවක් නවතිනු) නමැති නාට්‍ය බැලිය යුතුමය.

"කකෙ අයි" යනු එවැනිම සංවාදයකි. කරළියට නළුවන් පිවිසෙන පථයන් දෙකකි. "හොන් හනමිචි" (ප්‍රධාන පථය) සහ 'කරි හනමිචි" (ආධාරක මාර්ගය). මේ පථයන් දෙකෙහි සිටගෙන නළුවන් දෙදෙනෙකු විසින් කරන සංවාදයට "කකෙ අයි" යනුවෙන් හාවිතා වේ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජපානයේ රදළ යුගයේ තොරතුරු බොහෝ ජවනිකාවන්හිදී විදහා දක්වෙයි. එදා සේවකයෙකුගේ පරමාර්ථය වූයේ තමාගේ ස්වාමියාට තම ජීවිතය පිදීමයි. එසේ ජීවිතය පිදීමට අවස්ථාවක් ආවිට කඩුවකින් උදරය පළාගෙන සිය දිවි හානිකර ගැනීම සිරිතක් විය. මේ ක්‍රියාවට "හරා කිරි" හෙවත් "සෙප්පුකු" යනු කරළිය බසින් යෙදේ. මේ ක්‍රියාව නැති කබුකි නාට්‍යයක් කිසිසේත් නැත "චුෂින්ගුර" නම් නාට්‍යයෙහි මෙය හැඟීම් දනවන අයුරින් රඟ දක්වේ.

කබුකියෙහි එක් ප්‍රධාන ලක්ෂණයක් ඇත. එනම් එක කරුණක් දෙකක් රඟපෑමෙන් හඟවන්ට යන සියල්ල දළ වශයෙන් ප්‍රේක්ෂකයාගේ සිතතුළ දනවීමයි. ඊකකින් සම්පූර්ණ දෙයම හැඟවීමයි. සංකේතයන් ගෙන් අවශ්‍ය දර්ශනය ප්‍රේක්ෂකයන්ට සිතා ගැන්මට සාර්ථකලෙස සැලැස්වීම කබුකියේ තවත් අංගයකි. සංකේතයෙන් යම් දය දක්වීම නාට්‍ය කලාවේ උසස් අංගයකි. කබුකියෙහි ස්වාභාවික දේ සොයා යෑම විහිළුවකි. ඇසට රසවත්සේ අස්වාභාවිකව ඉදිරිපත් කිරීමම කබුකි නාට්‍යයේ ලක්ෂණයක් හෙයිනි. "කුරොමකු" නම් කළු තිරයක් පසුබිමට යෙදීමෙන් රාත්‍රිය සංකේත වශයෙන් දක්වයි. "යබුදතමි" නම් උණ ලීයෙන් සහ අතු රිකිලිවලින් නිමැයූ ඉස්කිරීමයෙන් අදහස් කෙරෙන්නේ උණගස් වනයකි. මුහුදු රැළි ඇඳි "නමි ඉත" නමින් හැඳින්වෙන ලෑල්ලකින් සංකේතවන්නේ මුහුදයි. කරළියේ දර්ශන සංකේත වලින්ද දක්වීම කබුකි නාට්‍යයේ උසස් බවට උදාහරණයෙකි.

ස්වාභාවික දෙය ස්වාභාවික වශයෙන් පෙන්වීම කබුකියේ පරමාර්ථය නොවේ. අස්වාභාවික දෙය ස්වාභාවික ලෙස ඉදිරිපත් කිරීමයි. "කුබිජික්කෙන්," "හරා කිරි" වැනි රළු ජවනිකා වලින් පවා කලාත්මක රසයක් ප්‍රේක්ෂකයින්ට දීමට කබුකි නාට්‍යය සමත් යැයි කීමෙන් අදහස් වන්නේද එහි අනුපමේය බවමය.

කබුකියට වර්තමාන ජපානයේද ඉතා උසස් තැනක් ලැබී ඇත. එය ජපානයේ සංස්කෘතියේ අඛණ්ඩ අංගයක් ලෙස ජපනා අදහයි. දහස් ගණන් ප්‍රේක්ෂකයන්ට ඉඩ ඇති නාට්‍ය ශාලා ජපානයේ සෑම තැනකම තිබීමෙන්ම කබුකියට ලැබී ඇති තැන මොනවට පැහැදිලිය. තෝකියෝහි, "මෙයිජිසා," 'ෂිම්බෂි එම්බුජෝ," "මිත්සු කොෂි," "කබුකිසා," 'තෙයිකොකුගෙ කිජෝ," "යුරකුසා" "තෝකියෝ ගෙ කිජෝ" යන නාට්‍ය ශාලාද, ඔසකාහි, "කබුකිසා," "නකසා," "බුන්රකුස" යන නාට්‍ය ශාලාද, ක්යෝතොහි "මිනමිසා" ශාලාවද, නාගොයාහි "මිසනෝසා" ශාලාවද ජපානයේ ප්‍රධාන නාට්‍ය ශාලාවන් ලෙස ගැනේ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අද ජපානයේ සිටින කබුකි නළුවන් ද නාට්‍ය ලෝකයේ ලබා ඇත්තේ අද්විතීය ස්ථානයෙකි. ජුකයි ඉචිකාවා, ජුසබුරෝ-බන්දෞ, ගන්ජිරෝ නකමුරා, නිසඑමොන් කතඔකා මිනොසුකෙ බන්දෞ සහ සෙන්ජකු නකමුරා දැනට සිටින පළපුරුද්දෙන් අග පැමිණි කබුකි නළුවෝය.

කිචි එමොන් නකමුරා, ඓතිහාසික පසුබිම් ඇති නාට්‍යයන්හි රඟපෑමෙහි රුසියෙකි. තොකියෝ නකමුරාට "ඔන්නගතා" ගේ කොටස රඟපෑමට ලැබී ඇති පළපුරුද්ද හා සහජ දක්ෂතාවය විශ්මය ජනකය "මිත්සුගෝරෝ බන්දෞ" සහ "එන්ගෝසුකේ ඉචිකාවා" නැටීමෙහි ගජ හපන්නුය.

ජපානයේ "ඉදෞ සංස්කෘතිය" ට (1600 1867) අයත් මේ 'කබුකි' නැත්නම් 'ක්‍යූගෙකි' නම් නාට්‍ය ක්‍රමය අද දක්වා නොනැසී පැවැතී ආයේ කෙසේද ? තමාගේ දෙයට ජපනාගේ ඇති ආදරය සහ එය උන්නතිය කරා ගෙනයාමට ඇති බලවත් අධිෂ්ඨානය නිසා මිස අනෙකක් නොවේ.

ඩී. පී. සෙන්දනායක.

*Whenever You Fly!*

*Wherever You Fly!*

**CONTACT**

AIR CEYLON LIMITED

Phone 7275.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# සාහිත්‍යයේ පරමාර්ථය ?

සාහිත්‍යාභිලාෂීන් හැම හැම දෙනෙක්ම වාගේ සාහිත්‍යයේ පරමාර්ථය කුමක්ද යන්න දැනගත් මා මේ මාතෘකාව තෝරාගත්තේ එකතරා පුවත් පතක් මඟින් සති කිහිපයක් තිස්සේ ඒ වෙනුවෙන් මත කිහිපයක් දරමින් වාදයක් ඇරඹුනු හෙයිනි [1]"වාක්‍යං රසාත්මකං කාව්‍යම්" යන්නෙන් අදහස් කෙරෙන පරිදි කාව්‍යය රසයෙන් පිරුණු කලාත්මක නිර්මාණයක් බව සාහිත්‍ය රසිකයන් පසක් කර, අවිවාදයෙන් පිළිගෙන තිබෙන බැව් අමුතුවෙන් කිවමනා නොවේ.

රස නිෂ්පාදනය පිළිබඳව මුල්මතය දැරුවෝ 'නාට්‍ය ශාස්ත්‍ර' ලියූ භාරත මුනිහුයි. භරතයන්ගෙන් සිට ආනන්ද වර්ධනයන් දක්වාම සංස්කෘත සාහිත්‍ය විචාර කලාව අලංකාරයේ විවිධ අංශවලට ප්‍රමුඛත්වය දෙමින් වැඩුණි. එහෙත් රසය හැමදෙනම අනුමත කළත්, රසය පිළිබඳව නියම මඟ හෙළිවූයේ ආනන්දවර්ධනයන්ගේ ධ්වනි වාදයෙන් පසුවයි. එමෙන්ම 'සාහිත්‍ය දර්පණය' ලියූ විශ්වනාථයෝ කාව්‍යය වනාහි රසාත්මක වාක්‍ය යැයි පැවසූහ. මේ නයින් බලන කළ කාව්‍යයක විශිෂ්ඨතම ලක්ෂණය කුමක්ද කියා ප්‍රත්‍යක්ෂ වේ.

සාහිත්‍යයේ මූලික පරමාර්ථය වන රස නිෂ්පත්තියෙහිලා සාහිත්‍ය කලාවෙහි, පරමාර්ථය හා එකට බැඳුණු, සක්තාවූ අංග කිහිපයක් ඇත. "කාව්‍යය වනාහි බලසම්පන්න හැඟීම් ස්වභාවික ලෙස ගලා ඒමයි" යනු වර්ඩ්ස්වත් කවියා කියතත්, හැඟීම් ප්‍රකාශ කිරීම කවියක පරමාර්ථය නොව එය අවශ්‍ය අංගයකි. රස නිෂ්පත්තියෙහිලා විවේකයෙන් කුපිතරගත් මනෝභාවයන්ගෙන් එය උද්ගතවේ. "කාව්‍යය වනාහි ඉතාම දුශ්ශීතිකවූ ලේඛනයක්' යැයි ඇරිස්ටෝටල් ගේ කියමනත් සත්‍යයෙන් තොරවූවෙකි. ගැඹුරුවූ දර්ශනයකින් කාව්‍ය රසයක් නිපදවිය නොහැක. කාව්‍යය ජීවිතය හෝ සමාජය හෝ විවරණය කරන්නෙකියි තවත් සමහරු අවිචාර වත්ව කියති. ජීවිත විවරණයක් හෝ සමාජ විවරණයක් හෝ මිනිස් සිත හෝ හද අළලා ලියන ලද්දක් හෝ කාව්‍යකින් විස්තර වියහැක. එනමුත් යම්කිසි කාව්‍යයෙක පරමාර්ථය වන රසය මිස එයින් එකක්වත් යැයි නිගමණය කළ නොහැකි බැව් වත්මන් පෙරදිග හා අපරදිග ශ්‍රේෂ්ඨ විචාරකයින් විසින් පිළිගෙන ඇත.

---

1 "Poetry is the spontaneons overflow of powerful feelings" - Wordsworth.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බඹරැන්දේ සිරි සීවලී හිමියෝ "සාහිත්‍යයේ පරමාර්ථය විය යුත්තේ සත්‍ය සෙවීම හා සෞන්දර්යය ප්‍රකට කිරීමක්" බැව් තර්ක කරති. මෙය සාහිත්‍යයේ පිළිගත් කුමණ විචාර ක්‍රමයක් අනුගමනයකර ප්‍රකාශකළ දෑයක් දැයි අවබෝධ කරගත නොහැක. සාහිත්‍යය පිළිබඳව නොහසළ බුද්ධියකින් තබා, සාහිත්‍යය තරමක් දුරටවත් අවබෝධකරගත් බුද්ධියකින් පවා මෙවැනි බොළඳ කීමක් ප්‍රකාශ නොවේ මැය. එක්තරා අපරදිග අවිචාරවත් විචාරයකු විසින් හෙළූ 'සෞන්දර්යය සත්‍යයයි සත්‍යය සෞන්දර්යය'යි[1] යන්න සිහිකරමින් විය යුතුය. එවැන්නක් ප්‍රකාශ කරන්නට ඇත්තේ. කලාවෙකින් සෞන්දර්යය මවාපෑම නොවේ. මූඛ්‍යකාර්ය වශයෙන් කෙරෙන්නේ එය බොළඳ තර්කයෙකි. පටු අපරිණත බුද්ධියකින් නිගමණය කරන ලද්දෙකි. "පෙදෙහි රසහව් විඳුනා-දෙනෙනා ඉතා දුලබෝ" යනුවෙන් කවි සිළුමිණ කතුවරයා කීවේ මෙවැනි බස් තෙපලු අයට යැයි සිතමි.

"කවිය නම් උසස් අදහසක් කමණීය භාෂාවෙන් ගීතවත් පරිදි කරන ලද රචනාවය" යනුවෙන්, පද්‍යාවලි සංග්‍රහයෙහි සාගර පලන්සූරිය හඳුන්වයි. ඒ අනුව උසස් අදහස, කමණීය බස හා ගීතවත් බව කවියක අංග තුනක් බව අප විසින්, පිළිගත යුතුව තිබේ. එය එසේ යැයි මම නොසිතමි. උසස් හෝ චේචා පහත් හෝ චේචා කවර සිදුවීමක් හෝ වස්තු බීජයක් හෝ ප්‍රතිභා පූර්ණ ලේඛකයා විසින් පාඨකයාට රසවත් ලෙස ඉදිරිපත් කළ හැක. එයට සුදුසු වචන තෝරාගත යුතු වුවත්, කමණීය, සාලංකාර භාෂාවක් හෝ ගීතවත් බවක් අවශ්‍යයැයි මම නොසිතමි. එසේ කියන්නේ කාව්‍යයෙක රස නිපැදවීමෙහිලා මේ අංග තුන අනවශ්‍ය හෙයිණි. එනමුත් කාව්‍යයෙක අත්‍යවශ්‍ය ලක්ෂණ වශයෙන් කුමාරණතුංග මහතා "කවිශික්ෂා" වෙන් දක්වන්නේ "රසවත් බවත් නිදෙස් බවත්" පමණි. "රජවත්වූ නිදෙස්කීම කවියෙකි." "රසවත්" යන්න පුළුල් අර්ථයෙන් ගත්කළ, රසවත් වීමත් නිදෙස්වීමත් පමණක් කාව්‍යයක් වීමට අවශ්‍ය අංග දෙක බැව් සිතිය හැක. නිදසුනක් ගෙන බලමු. රැ. තෙන්නකෝන් ගේ හැවිල්ලෙහි එන 'කැකුළු හැවිල්ල" පලිගැනීමේ චේතනාවෙකින් කෙරුණු යැදිල්ලක් බව ව්‍යඞ්ගයෙන් කියවේ. එහි ඇත්තේ රෞද්‍ර රසයක් වුවත් කනස්සල්ලක් වැන්නක් නොවේ. එනමුත් එහි උසස් අදහසක් හෝ කමණීය භාෂාවක් හෝ ගීතවත් බවක් ඇත්තේ යැයි සිතිය නොහැක. එමෙන්ම ඒ වැණුම හැවිල්ලෙහිම එන රසවත් වූත් සාර්ථක වූත් කොටසෙකි. එමනිසා

1 "Beauty is Truth; Truth Beauty"



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සාහිත්‍ය ව්‍යාපාරයෙහිලා මූලික රසයට හානි නොවෙන අඳුමට් බාහිර අලංකාරෝක්තීන්ගෙන් පිරවීමක් නොකොට, එහි රසය උද්පාදනය කෙරෙන අයුරින් කාව්‍යය සකස්කිරීමයි, ඉදිරිපත් කිරීමයි, කවියා සතුව ඇත්තේ.

"කාව්‍යය හැඟීම් ප්‍රකාශකිරීමක් නොව හැඟීම්වලින් ගැලවීමකි." මෙය දක්ෂ විචාරකයකු වන ටී ඇස් එලියට්ගේ කියමනකි. "ලොව පහළවූ කිසිම උසස් සාහිත්‍ය කරුවෙකු සාහිත්‍යයක් බිහිකොට ඇත්තේ අනුන්ගේ ජීවිත විවරණය කරනු පිණිසවත් අනුන්ගේ දුක්ගැනවිලි අදෝනා හෙළිකරනු පිණිසවත් නොවේ. තමාගේ ම ආත්මයේ එක් කොටසකින් ගැලවෙනු පිණිසය" යනුවෙන් ගුණදාස අමරසේකර උත්තම ගණයේ කාව්‍යයක් බිහිකිරීමෙහිලා ආත්මප්‍රකාශනයක් ම කළයුතු බව පවසයි. මෙහි කිසියම් සත්‍යයක් නැතැයි මම නො අදහමි. එහෙත් සාහිත්‍යයේ උසස් කෘතියක් නිපදවීමෙහිලා එයම විය යුතුයැයි විශ්වාස නොකරමි. එසේ කියන්නේ අමරසේකර මහතාගේ මතයෙහි පොදුවසයෙන් පිළිගත හැකි අගයක් නොමැති නිසයි. "කාව්‍යය හැඟීම් ප්‍රකාශ කිරීමක් නොව හැඟීම්වලින් ගැලවීමකි" යනුවෙන් ටී. ඇස් එලියට් කීවේ ගුණදාස අමරසේකර මහතා අදහස් කළ පරිදි පුද්ගලාභිවාදනයකට නොවේ. කවියාගේ ඉන්ද්‍රියයන්ට ගෝචරවූ මනොභාවයන් පාඨකයා ඉදිරියේ මවාපෑමේ හැටියක් බවයි එලියට් එසින් අදහස් කළේ. මෙය වඩාත්ම පැහැදිළිවත්නේ එලියට් විසින්ම පැවසූ තවත් මතයක් නිසාය එනම් "කාව්‍යය පුද්ගලිකත්වය ප්‍රකාශ කිරීමක් නොව පුද්ගලිකත්වයෙන් වෙන්වීමකැයි" යන්නය. අමරසේකර මහතා පුද්ගලික අත් දැකීමක් කීයනවිට සිංහල සාහිත්‍ය නැඟීමේදී මාර්ටින් වික්‍රමසිංහ මහතා පවසන එවැනිම වූ මතයක් සිහියට නැංවේ. "කාලිදාස හිමාලය වර්ණනා කෙළේ, හිමාලය ඇසින් දුක එහි සෞන්දර්යයෙන්ද උදාන විලාසයෙන්ද සන්තොෂවූ බැවිනි. ලක්දිව මහා නිම්නයෙන් ඈතට නොගිය, සමහර සිංහල කවීන් දඹදිව පිහිටි හිමාලය වර්ණනා කෙළේ, පොතින් අවුලාගත් මිථ්‍යාකතා අනුව සිතින් මවාගත් හිමාලයෙකි" (සි: සා: නැ: පිට 38) මෙයේ කවියා විස්තර කරන සැම දෙයක්ම පිළිබඳ ඔහුට පෞද්ගලික අත් දැකීමක් තිබිය යුතුයි යන්න සාවද්‍ය මතයෙකි. එමෙන්ම එම අදහසේ හැටියට කවියා තමා රචනා කරන කාව්‍යය ආශ්‍රයෙන් සවකීය පුද්ගලිකත්වය පාඨකයාට හෙළි කළ යුතුය. මේ මතයෙහිලා මාර්ටින් වික්‍රමසිංහ මහතාත් ගුණදාස අමරසේකර මහතාත් සම අදහසක් පහළ කරති. කාව්‍යයක් ඇසුරෙන් එය රචනා කළ කවියාගේ ජීවිතය පිළිබඳව තතු හෙළිවිය යුතු යන්නය දෙදෙනාම කියන්නේ. එක් අවදියකදී බටහිර පැතිරී තිබුණු මතයකි මෙය. එනමුත් කාව්‍යයකින් එය රචනාකළ කවියාගේ ජීවිතය පිළිබඳ තොරතුරු සෙවීම ශාස්ත්‍රානුකූල නොවන බැව් නූතන විචාරකයින්ගේ පිළිගැන්මයි. එමෙන්ම කාව්‍යයේ

රස නිෂ්පාදනයෙහිලා ආත්ම ප්‍රකාශණයක් කිරීම අවශ්‍යය ම යැයි කිව නොහැක. නොයෙක් දෙනාගේ අත් දුකීම් හා සහජ කවිත්වයේ හැටියට නවර සිදුවීමක් හෝ විස්තර කළහැක. මේ අනුව සරච්චන්ද්‍ර මහතා සිය "කල්පනා ලෝකයෙහි" මෙසේ පවසයි. "නොයෙක් දෙනාගේ අත් දුකීම්, නොයෙක් දෙනා සිතන හැටි, නොයෙක් දෙනාට දුනෙන අයුරු තම කල්පනාව යොදා අවබෝධ කර ගැනීමේ අපූරු ශක්තිය ප්‍රතිභාසම්බන්න කවියා තුළ තිබෙන් නකි. මෙය පොදු මිනිසාට නැති ශක්තියකි. පොදු මිනිසාට අනුන්ගේ හෘදය, අනුන්ගේ මනස ගොදුරු වන්නේ ස්වල්ප වශයෙනි." ආත්ම ප්‍රකාශණයකින් උසස් කෘතියක් ගොඩ නැගෙන්නක් යැයි පමණක් විශ්වාස කරන අමරසේකර මහතාට පොදු මිනිසාගේ සිත ක්‍රියාකරන සැටි අවබෝධකර ගැනීමට තියුණු බුද්ධියක් නැති බවයි අපට හැගෙන්නේ. නො එසේනම් ඔහුට අනුන්ගේ සිත පෙනෙන්නේ වැරදි ලෙසටය. එමනිසා නවර රසයක් හෝ පාඨකයාට දීමට අදහස් කරන්නක් අනුවයි කතාකාරයා කිසියම් වස්තු බීජයක් වැනුම් කිරීමට තෝරාගන්නේ. ආත්ම ප්‍රකාශනයකින්ම නොවේ උසස් කෘතියක් හෝ උසස් රසයක් පහලවන්නේ. [1] "අපගේ දුක්බර ගී අප ගයන ඉමිහිරි ගී විය හැක" එහෙයින් රස නිපැදවීමෙහිලා ඕනෑම දුකක් පවා සුඛාත්මක පක්ෂයකට හරවා ගත හැක.

තවද රස නිෂ්පත්තියෙහිලා කලාත්මක සංයමයක් මෙන්ම කලාත්මක එකාබද්ධතාවක් තිබිය යුතුය. එවිටයි පාඨකයාගේ හදවතට ඒ මූලික රසය එක්වරම ගොචරවන්නේ. ජී බී. සේනානායක ගේ කථා රචනයෙහි පෙණෙන විශිෂ්ඨ ලක්ෂණයක් නම් කලාත්මක සංයමය බැව් කිව හැක. සිතට ගලා එන හැම දෙයක්ම එලෙසම බහාලීමෙන් පාඨකයා වෙහෙස විය හැක එය සංයමකින් ඉදිරිපත් කළ යුතු යැයි කියන්නේ එහෙයිනි.

සාහිත්‍යයේ පරමාර්ථය වෙනුවෙන් රසාස්වාදය විනා වෙනයම් විදියේ පුහු මත මේ ලිපියෙන් බිඳ දැමීමෙහිලා සමත්වන්නට ඇතැයි සිතමි. එමෙන්ම ඒ රසාස්වාදය ආත්ම ප්‍රකාශණයකින් පමණක් නොව නොයෙක් කවීන්ගේ නානා අත් දුකීම්, චින්තාසංකල්පයන් හා සහජ කවිත්වය අනුව හැඩගැසෙන්නක්ය යන බව මං නවදුරටත් පැහැදිලිකර ඇත.

ආරියසිංහ ලියනගේ

---

1 "Our sweetest songs are those that tell of saddest thought"



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# චූටි මල්ලි

"අම්මේ ! අම්මේ"

චූටි මල්ලි අම්මාගේ රෙදිපටෙහි එල්ලී ඇගේ මූහුණ දෙස බැලීය "අම්මේ !" ඇගේ රෙදිපටින්ද ඇද්දේය.

අම්මා කුස්සියේ සිටි ගැහැණුන් කීපදෙනෙකුට වැඩකළයුතු පිළිවෙල කියා දුන්නාය

"හාමිනේ ! එහෙනම් දූන් හොඳයි එලවලු ටික කපල හෝදල ගත්තහම" මෙසේ කීවේ සැම්පි අක්කාය

"ඔව් දූන්මම පටන්ගත්ත එක හොඳයි" අම්මා එය අනුමත කළාය

"අම්මේ! අම් – මේ !" චූටි මල්ලි උස්හඬින් අම්මාට කතා කරන්ට විය.

"ඔව් පිරිත පටන් ගන්න ඉස්සරවෙලා ඉන්න අයට කෑමටික දීලා ඉවරයක් කරගත්තොත් ලේසියි නේද හාමිනේ !" මෙවර යෝජනා කලේ ඇලිස් අක්කාය.

ඒ අතර චූටි මල්ලි අම්මාගේ රෙදිපටින් අදියි. කෝපයෙන් මෙන් දෙබැම හකුළුවයි. වරෙක හැකිපමණ ශබ්දනගා "අම්මේ" කියයි එවිටම "කරුස් ! කරුස්!" යයි බෙලෙක් පතුරකින් වළඳක් සූරන හඬ පිළිකන්නෙහි ඇසේ. ඉදුල් පිඟන් ගොන්නක් දූතින්ම බදාගත් ලිසී මැද මිදුලට බැස්සාය. "ලිසී ! ලිසී ! ඔය මැද මිදුලෙ තියන් අද ඕව හෝදන්න එපා. අර පිලිකන්නෙ කාණුව ලඟට ගනින්. අර ලොකු බේසමට වතුර එකක් පඩිය උඩ තියාගෙන හෝදපන්." අම්මා මහ හයියෙන් කීවාය.

"ඒක නොවෙයි උඹලා දූන් ඔක්කොම දවාලට කාලබීලා ඉවරද" අම්මා නැවත කුස්සිය දෙසට හැරී ඇසුවාය.

'ඔව් ! හාමිනේ, ඔව් !"

"අපේ කෑම නම් පරක්කුවුනත් මක්කැයි හාමිනේ." කුස්සියේ සිටි ගැහැණුන් එකවරම පිළිතුරු දුනි.

"එහෙම බැහැ උඹලා දවල්ට කාල ඉන්න ඕන රෑට උයන්න පටන්ගන්න. කවුරුවත්හෙම තාම කාපු නැති කෙනෙක් ඉන්නව නම් කාල ඉවරයක් කරල ඉන්න ඕන ඇහුනද ?" අම්මා නැවත කීවාය.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

චූටි තවමත් අම්මාගේ රෙදිපටින් අදියි. අම්මේ කියා කෑගසයි. අම්මා එය නෑසුනාක් මෙන් කුස්සියේ සිටි අය සමග කතාවෙහි යෙදී සිටියාය. චූටි මෙවර අම්මාගේ රෙදිපටින් ඇද්දේ දත්මිටි කාගෙනය. ඇගේ රෙදිපිට ලිහිල් වූයෙන් එය එක් අතකින් අල්වාගත් අම්මා, "මොකද ? දරුවො ! කරදර නොකර අහකට පලයන" කීවා මිස චූටි දෙස බැලුවේවත් නැත. ඒ ඉන් තවත් කෝපවිය. ඇගේ දෙපා වට දෑතයවා ඇය සොලවන්නට තැත්කළේය. කකුලක් පොලවේ හපා "අම්මේ"යි කෑගැසීය. එහෙත් අම්මා සෙලවීම චූටි මල්ලිට කළහැකි කාරියක් නොවීය. ඔහුගේ කෝපය තවත් දැඩිවූනි. ඔහු සුරත ඔසවා අම්මාට වැරයේ පහරක් ගැසීය.

"මේ දහක් වැඩ තියෙන වේලාවෙ කරදර නොකර අහකට පලයන් පුතෝ"යි කිව් අම්මා මල්ලිගේ අතින් ඇද ඔහු පැත්තකට කළාය.

"ලිලී මෙහෙ වරෙන් අර පොඩිහාමි අක්කා හොයන්නේ මොනවද අහල අරන් දීපන් උඹ ලඟ ඉඳල උවමනා බඩු හොයා දීපන්" කුස්සියේ ඒ මේ අත මොනාකදෝ සොයමින් කොඳුරන්ට වූ පොඩිහාමි අක්කා දුටු අම්මා ලිලීට මෙසේ පැවසුවේ ඈ නිතර ගෙදර වැඩකරන මෙහෙකාර කෙල්ල නිසාය. කුස්සියේ වැඩකළ අනේක් ගැහැණු අහල පහල ගැමියෝ වූහ.

මල්ලි මහ හඬින් ඇඬුවා, දෑතින් කෙස් කඩාගත්තා, දෙකොපුල් දිගේ කඳුළුකැට බේරෙන්ට වූනා "මොකද ? මොකද මේ චූටි මහත්තය අඩන්නේ ?" මිසි අක්කා මල්ලී වඩාගන්න තැත්කළාය. ඔහු තවත් බෙරිහන් දෙන්ට විය. "ඇයි පුතේ ? මොකද පුතේ ? පුතාට මොනවද ඕන ?" අම්මා ඔහුගේ හිස අතගාමින් විමසුවාය. ඔහුගේ හැඬුමද ටිකෙන් ටික අඩුවිය.

"අම්මේ තාත්තත් අද එනවැයි" ඇසූ චූටි මල්ලි අත්ලෙන් කඳුළු පිසදාගත්තේය. මුලු කුස්සියේම පැතිරගියේ මෙතෙක් නොතිබුණු නිහැඬියාවකි. එකිනෙකා එකිනෙකාගේ මූහුණු බැලීය. "ඔව් පුතෝ ! අඩන්නෙ නැතුව යන්න. ගිහින් සෙල්ලම් කරන්න පුතා. අම්මට හුඟක් වැඩතියෙනවනෙ. පුතා ගිහින් සෙල්ලම් කරන්න " අම්මා නිහැඬියාව බිඳිමින් කීවාය. මල්ලී තවත් එහි නොරැඳින. ඔහු කුඩා දෑත විසිකරමින් උඩපනිමින් දුවගියේ ආලින්දය දෙසටය මොහොතකට පෙර වරක් හැඬූ බවට කිසිම ලකුණක් ඔහුගේ මුහුණේ නොවීය



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"පුතේ ! කීර්ති මල්ලි පාරට යාවී. මල්ලිවත් ටිකක් බලාගෙන ඒ පැත්තෙන් ඉන්න පුතේ" අම්මා මෙවර අණකළේ මෙතෙක් කුස්සියේ උළුවස්සට හේත්තුවී බහා සිටි මටය.

"කෝ සුදු අක්කා"යි අසමින් අම්මා කුස්සියෙන් එළියට විත් වහ වහා කෑම කාමරය දෙසට ගියාය. අම්මා රෙදිපට ඔසවා මුහුණ පිසදමනවා පිටුපස බැලූ මට පෙනුණි. මල්ලි පසු පස යනවාට වඩා කුස්සියේ කෙරෙන වැඩ දෙස බලා සිටීමටත් ඔවුන් කියන විහිලු කතා ඇසීමටත් මම ප්‍රිය කෙළෙමි. "ලොකු අය කතාකරන තැන්වල කට දිහා බලාගෙන ඉන්න පුරුදු වෙන්න එපා"යි අම්මා දවසක් මට තරවටු කළ සැටිද මතක්විය. අම්මා නැවත කුස්සියට නොඒවියයි සිතුනෙන් මා එහිම නතර විය.

"එදා ලොකු එකීට බඩගාය හැදුන දවසෙත් උන්ගෙ තාත්තා දුවගෙන ඇවිත් කිච්චහම සල්මත් අනේ කාර්එකින් ඇව ඉස්පිරි තාලෙට පිටත් කළා අනේ එහෙම පිං කඳක්" සැම්පි අක්කා මෙසේ කිව්වේ තාත්තා ගැන බව මට වැටහුනි. "අපේ තාත්තගෙ මරණෙ දවසෙ මුදලාලි මහත්තය පිහිට නොවන්න අපට ඒ වැඩ කටයුතු ටිකවත් කරගන්න විදියක් තිබුණෙ නැහැ."යි මිසි අක්කා කීවාය. ඇගේ කටහඬෙහි ශෝකී භාවයක් රැඳී තිබුණි.

"මොනව අහනවද බං! ගමට හිටිය රජෙක්නෙ. උන්දැගෙ මේ පොඩි පොඩි දරුපැටව් ටික අනේ! උන්දැගෙ මේ මුලු පවුලටම හතර නිධාණෙ පහල වෙන්න ඕන" මෙවර කීවේ කොළොම්බුවක් මත ඇනතබාගෙන බුලත් විටක් සපමින් සිටි සරෝනාම් ආච්චිය. ඇයට අප ආච්චි කිව්වේ ඇය අපේ අම්මාගේ වත්, තාත්තාගේවත් අම්මා නිසා නොවෙයි. ඇයද අප ගමේම සිටි මහලු ගෑහැණියකි. අපේ අම්මා ඇයට අමතන්නේද ආච්චියේ කියාය. ඔවුන් නොරතෝත්වියක් නැතිව කතාකළේ තාත්තා ගැනයි. තාත්තාගේ නිර්ලෝභී කම ගැනත් කාරුණික භාවය ගැනත්ය වරෙක කෙනෙක් අම්මාගේ නිර්ලොභී කම ගැනද කීවාය. නමුත් ඔවුන් වැඩිපුර කතාකළේ තාත්තා ගැනය.

අපේ ගෙදර කුඩා නොවිලයක් වුවත් ගමේ අහල පහල අය එක්වී වැඩට සහායවීම සිරිතක් විය. එකල තාත්තා ගමේ තරමක පොහොසතෙකි. ගමේ කවුරුත් එක්වී අපේ ගෙදර වැඩට සහාය වූයේ තාත්තාගෙනුත්, අම්මාගෙනුත් ඔවුන්ට උදව් උපකාර තිබෙන නිසායැයි මට සිතුණි.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අම්මා නැවත කුස්සිය දෙසට එනු දුටු මම ඉන් ඉවත්වී ආලින්දය දෙසට ගියෙමි. සුදු අක්කා ඇගේ ඇඳ උඩ වාඩිවී ගලේගෙදර අක්කලාත්, බෙල්ලන සුදු අක්කාත් සමග මොනවාදෝ කතාකරමින් උස්හඬින් සිනාසෙනු ඇගේ කාමරය පසුකර ගිය මම දුටිමි.

"අන්න සුදු අක්කව අම්ම හෙව්වා"යි මා කීවේ ටිකකට පෙර කුස්සියේදී අම්මා 'කෝ සුදු අක්කා"යි ඇසූ බව සිහියට ආ බැවිනි. ආලින්දයට ගිය මා වටපිට බැලූවත් චූටි මල්ලී එහි නොවීය. මම "චූටියි" කීපවරක් හඬනැගීමි. එහෙත් මල්ලී අහලකවත් සිටින බවක් නොපෙනින රතු අයියාත්, සුදු අයියාත්, බෙල්ලන අයියාත්, හොරන විමල් අයියාත් ආලින්දයේ කොනක 'කාර්ඩ්ස්' සෙල්ලම් කරමින් සිටියහ. "කීර්තිව දැක්කද"යි මා ඇසුවත් ඔවුන්ගෙන් කිසි පිළිතුරක් නොලැබුණි. "හඃ! හඃ!! හා!!! ඒ ගොඩ මටයි" රතු අයියා බෙරිහන් දෙමින් ටීපෝව මතවූ කාර්ඩ්ස් එකතු කරන්ට විය. මා මිදුලට ගියේ කීර්ති මල්ලී සොයන අටියෙනි. ඔහු බලාගන්නට අම්මා මට අණකළ බැවින් ඔහු කොහේ ගියාදැයි මා සෙව්වේ බියමුසු කුතුහලයකිනි. ගේ අයිනේ තිබුණු කාණුව අසල බිත්තියට හේත්තුවී චූටි මල්ලීත්, රංජි මල්ලීත් ලොකු කතාවක් කරන බව මා දුටුවේ පිළිකන්නට ගියවිටය. "වසන්ත්කෝ කියන්න අද තාත්තත් එනවද කියලා. මේ කීර්ති මල්ලි කියනව අම්මත් කිව්වලු තාත්ත එනවැයි කියල" මා දුටු රංජි මල්ලී විමසුවේ මහත් කුතුහලයකින්ය. 'ඔව්! නේද වත්තක්කේ? අද අපේ තාත්ති එනව අපට ඇපලුත් ගේනව, කෝතුත් ගේනව, දොඩනුත් ගේනව" තමා රංජි අයියාට වඩා දන්නා බවක් හඟවමින් චූටි මල්ලී කීය. මා කිසිවක් කීමට පෙර චූටි මල්ලී නැවත කතාකරන්ට විය. "අර 'න'සිමනුත් කිව්ව අද තාත්ති එනවැයි කියලා. තාත්ති එන හිත්දලු අර අම්මලා හුනාරියක් බයි හදන්නෙ. අර අපේ ගෙදර වෝක් 'තුදු' කරෙත් තාත්ති එනහින්ද කියල 'නයිමන්' කිව්වා "මල්ලිගේ කඩහඬෙහිද ප්‍රීතියක් රැඳී තිබුණි. මල්ලී "නයිමන්" කීවේ ගෙදර වැඩකරන සයිමන් කොලුවාටය. ඔහු කතාකලේ ලොකු අයෙකු මෙන් හිසද සොලවමින්ය. "අක්කෙ රංජි අයිය කියනව එන්නෙ නැතිලු තාත්ති 'වොක්' කාර්එකෙන් එව් අර එදා වගේ නේද අක්කෙ ?" චූටි නැවතත් කීය.

"හු–හාක් රැවෙව්ව්ද අක්කෙ තාත්ත එනකොට" මෙවර ඇසුවේ රංජි මල්ලීය.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"මල්ලි තාත්තිට හුඟාක් ආදරේද චූටි"යි මා කීර්තිගෙන් ඇසුවේ වෙන අහන්නට දෙයක් මතක් නොවුන හෙයිනි. "ඔව් මේ-ච්චර ආදරෙයි" හේ කුඩා දෑත හැකිපමණ දෙපසට විහිදුවන් නට තැත් කළේය. ඒ අතර ඔහුගේ පාදෙක උස්වෙන හැටිද මම දුටිමි. එහෙත් චූටි ඉන් සෑහිමකට පත්නොවීය. "නෑ මං ආසෙට තරම් ආදරෙයි තාත්තිට" "මාත් අහසටත් වැඩිය ගොඩක් ආදරෙයි" රංජී මල්ලිත් කීය චූටි මල්ලිගේ මූහුණ මලානික විය. ඔහු රංජී දෙස යටැසින් බැලීය.

"නෑ-මමයි ගොඩා-ක් ආදරේ රංජී නොවෙයි." 'රංජී අයියා' යි නොකීවේ මල්ලිට තරහගිය බැවින් බව මම දැනගතිමි.

"ඔව්! ඔව්! කීර්ති තමයි ගොඩක් ආදරේ" මමද කීර්ති මල්ලි අනුමත කළේ ඔහු හඬන්නට පටන් ගත්තොත් ඔහු සනසා ගැනී මට පහසු කාරියක් නොවූ හෙයිනි.

"ඉතින් තාත්තිත් මල්ලිට හුඟාක් ආදරේද" මා මෙසේ විමසුවේ කුමක් නිසාදැයි මම නොදත්තෙමි.

"ඔව්! මටයි ආදරේ. මට කොළඹ ගියාම ඇපල් දුන්න. 'චුද්දප් පලං' දුන්න. අර මං තාත්තිගෙ ඇඳ උඩ ඉන්නකොට මට ඇපල් කැව්වෙ තාත්ති. දෙඩනුත් දුන්නෙ මටයි ආදරේ. මාත් අපේ 'තුදු' තාත්තිට ගොඩා-ක් ආදරෙයි." මොහොතකට පැවතියේ තද නිහැඬියාවකි. නැවත "අර මං තාත්ති ලඟ 'කුංගුං', කුංගුං' කියල නිදාගත්තෙ තාත්ති ලඟනෙ මං නිදාගත්තෙ. අද තාත්ති ආවම මං ' කුංගුං, කුංගුං" කියලා තාත්ති ගාව නිදියනවා. නේද අක්කේ" ඔහු පොරතෝංචියක් නැතිව කියන්නට විය. ඔහුගේ හුරතල් මූහුණ සොම්නසින් පිරී තිබුණි. චූටි දෙස බලා සිටින රංජී මල්ලිගේ කට නොයෙක් ලෙස වෙනස් වනවාත් ඔහු හිස ඒ මේ අත හරවනවාත් හොරැහින් ඔහු දෙස බැලූ මට පෙනුණි.

චූටි යංනම් මහ තෝරන විශේ සිට ' කුංගුං, කුංගුං" කියමින් තාත්තාගේ කණක් අල්ලාගෙන නිදාගන්ට පුරුදුවූ සැටි මට නාම මතකය. ඔහු තරමක් ලොකුවූනාට පසුද කණට කිවේ "කුංඥං" කියායි චූටි හදිසියේ ගෙට දුවගියේ ඇයි දැයි මා තේරුම් ගත්තේ ඔහු පුටුවක් උඩට නැග සාලයෙහි බිත්තියේ එල්ලා තිබුණු තාත්තා ගේ පින්තූරය අල්ලන්නට මෙන් අතක් දිගුකරගෙන ඇඟිලි තුඩු මත නැඟී සිටිනු දැකීමෙනි.

"වන්නක්කෙ තාත්තිව මට අරං දෙන්න" මල්ලිට පිංතූරය ලඟට ගන්න ඕනෑවූ බව මට වැටහුණි. "අනේ! මට පුළුවන්යැ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මාව උස නැහැ. මට නම් බැහැ'' මා එදා කිව්වේ බොරුවක් නොවේ. එදා යංතම් අට හැවිරිදි වියේ පසුවූ මා කුඩා එකියෙකි. ''මං අම්මට කියනව අරගෙන දෙන්න''යි කිව් චූටි ඉක්මනින් පුටුවෙන් බසින්ට නැත්කිරීමෙන් නොවැපී බේරුණේ මා ඔහු අල්ලා ගත් බැවිනි. ''අම්ම තරහ වේවි. මල්ලිට අම්ම කිව්ව නේද වැඩ තියෙනව කියල කරච්චල් කරන්න එපා කියල'' මා කීවේ මල්ලි අම්මා සොයා යෑම වැලැක්වීමටය. අම්මාට කරදර කර නැවත චූටි හැඬුවොත් ඔහු සනසා ගැනීම මටම සිදුවන බව මම දැන සිටියෙමි. චූටි ටික වේලාවක් පුටුවට හේත්තුවී බලාසිටින්ට විය ලොකු අයියා ඒ අසල සිටි බව මා දුටුවේ මල්ලි ඔහුවෙත දුවගොස් තාත්තාගේ පිංතූරය ගලවා දෙන්නවැයි අච්චිලි කළ විටය. අයියා සිටි තැනින් තවත් අඩිදෙකක් පස්සට තැබීය. අයියා හිස ඒ මේ අත හරවමින් තවමත් වැඩ නිමනොවූ පිරිත් මණ්ඩපය දෙස බලා සිටියි. 'තාදලුයි, බුලත් ඉති ටිකයි පස්සෙ එල්ලුවත් ඇති'' ඒ තුලවූ බාප්පා අයියාට කීය.

''ඔව් එක නම් පස්සෙ බැරියැ. බාප්පෙ මේ පහන කොටසට තව 'සිල්වර් ඩස්ට්' ටිකක් වැටුනනම් හොඳයි'' අයියා පිළිතුරු දුනි.

''අයියෙ තාත්තිව අරන් දෙන්නැ''යි මල්ලි තවමත් ඇච්චිලි කරයි අයියාගේ අතින් අදින්ටත් වූ විටය අයියා ඔහු ඉල්වන දෙය ගැන සිත යොමු කළේ.

''මොනවද කීර්තිට ඕන.'' නමුත් මල්ලිගෙන් පිළිතුරක් මෙවර නොලැබුණි. අයියාද අකමැත්තෙන් මෙන් 'මොනවද කීර්ති'යි අසමින් පිරිත් මණ්ඩපය දෙසට යොමුවූ නෙත් ඇතිව ඔහු පසු පස ගියේය.

''චූටි තාත්තව අරන් ඉල්ලනවා'' මා මෙසේ කීවේ චූටි ඔහුට උවමනා කුමක් දැයි නොකිව් බැවිණි. මල්ලි තාත්තාගේ පිංතූරය ඉල්ලා සිටීනම් එය ඔහුට ලබාදෙන නෙක් ගෙදර අයට කරදර කරයි. එහෙයිනි තාත්තාගේ ලොකු පිංතූර දෙකින් එකක් නිතරම තාත්තාගේ කාමරයේ ඇඳ උඩ වූයේ. එනෙත් එදා ඒ පිංතූර දෙකම බිත්තියේ එල්වා තිබුණි. අයියා පුටුවකට නැංගේ පිංතූරය ගලවන අදහසිනි.

''එපා! එපා! ඕක මට එපා! මට ඕනෙ අරකයි'' මල්ලී අනෙක් පිංතූරයට අත දිගු කළේය. ''බැහැ මේ කීර්ති එක්ක'' අයියා කීය. ''එපා! ඕක මට එපා ඒකෙ තාත්ති මා එක්ක තරහයි මට එපා එක'' මල්ලි කීවේ ඇත්තය. ඒ පිංතූරයේ තාත්තාගේ රූපය



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දැක්වුණේ තාත්තා තරහින් බලාසිටින ලෙසය. අනෙක් පිංතූරයේ තාත්තා දත් පෙනෙන ලෙස සිනාසුනේ හැනත් තාත්තා සිටියේ සිනාමුසු මුහුණින්ය. අයියා නැවත තව පුටුයක් මත නැග පිංතූරය ගලවා තාත්තාගේ නිදන කාමරයේ ඇඳ මත තැබීය. "ඔන්න චූටි බිඳින්න හෙම එපා"යි කී අයියා නැවත පිරිත් මණ්ඩපය දෙසට පා නැගීය. මම චූටි මල්ලී සමග කාමරයට ඇදුනෙමි. "අක්කෙ මේ කුංගුං තියෙන්නෙ. අල්ලන්න බැහෙ" මල්ලි මින් හැඟවූයේ තාත්තාගේ කණ අල්ලන්නට නොහැකි බවය.

"අපේ 'තුදු' තාත්ති 'තාදු!' 'තා – දූ' " දැත් එක්කොට පිංතූරයේ මුහුණ හොවා තාත්තාට කීපවරක්ම මල්ලී වැන්ද, වීදුරුව දෑතින් අල්වාගෙන තාත්තා සිඹින්ටත් වූනා 'කුංගුං' 'කුංගුං' කියමින් පිංතූරයේ පෙනෙන තාත්තාගේ කණ අතගාන් තාක් මෙන් සිඟිති ඇඟිලි තුඩු වලින් වීදුරුව පිරිමදිමින් පිංතූරයේ කොනක හිස තබාගත්තා. ටික වේලාවකින් චූටි තද නින්දක යෙදී සිටින බව මා දුටුවා ඔහුගේ පියවී තිබුණු දෙනෙත් පවා ප්‍රීතිය රැඳී තිබුණා. මල්ලී අසලම මමද ඇඳ මත සිටියෙමි.

මල්ලී හඬන්නට විය මාත් ඔහු අසලම නින්දට වැටුනු බව තේරුම් ගත්තේ එවිටය. වෙනදා නැති අමුතු සිරියාවකින් මුලු ගෙයම පිරී තිබුණි. බැලූ බැලූ පැත්තේ දෙතුන් දෙනා එක්වී කතාකරමින් සිටියහ.

චූටිත් අතින් අල්වාගෙන මම සාලයට ආමි. විදුලි ආලෝකය නිසා ගෙදරට අමුතු සිරියාවක් ලැබී තිබුණි. චූටි පමණක් නොව මමද පුදුමයෙන් මෙන් උඩ බැලීමි. පිරිත් මණ්ඩපය පාට පාට විදුලි බුබුලින් බැබලුන නිසා වඩාත් ලස්සනට පෙනුනි. චූටී මගේ අත ගසා දැමීය. කෑගසමින්, උඩපනිමින්, සිනාසෙමින් ඒ මේ අත දුවන්ට විය.

"පුතේ අන්න කීර්ති මල්ලි නැගිටලා එක්ක ඇවිත් වැඩ ගොඩවෙන්න ඉස්සරවෙලා බත් ටිකක් කවන්නැ" අම්මා මෙවර කිව්වේ සුදු අක්කාට බව ඇය මල්ලී වෙත එනවිට සිතාගතිමි.

"එන්න චූටි, බයි කන්න"යි කියමින් සුදු අක්කා චූටිව වඩාගන්න තැත්කළාය. චූටි සුදු අක්කාගේද අත ගසා දැමිය.

"චූටි බබා බයි කන්නේ පස්සේ"යි හේ කීය.

අක්කාට මල්ලී එක්ක යැමට නොහැකිවිය. එහෙයින් ඇ ආපසු ගෙට ගියාය.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"තාත්තත් ආවමයි චූටි පුතා බයි කන්නෙ හෝද අක්කේ" මල්ලී මෙසේ කීවේ අක්කා ගෙට ගිය පසුය.

දුව පැන විඩාපත්වූ මල්ලී අම්මා සොයමින් ගෙට ගියේය. අම්මා කෑම කාමරයේ පුටුවක් මත වාඩිවී පුංචි අම්මලාත් ලොකු අම්මලාත් සමග මොනවාදෝ සිනාමුසු මුහුණුන් කීවාය. සුදු අක්කාත් ජනේලයකට පිටදී සිටියාය. සුදුරෙද්දක් අතුරන ලද මේසය මත රෑ කෑම පිළියෙලවී තිබුණි. මල්ලී දුවගොස් අම්මාගේ දෙදන මත හිස තබාගති.

"ඇයි පුතේ! බත්කන්නෙ නැද්ද චූටි පුතා" අම්මා ඉතා ආදරයෙන් මල්ලීගේ හිස අත ගෑවාය. නමුත් මල්ලී කිසිවක් කීවේ නැත.

"අන්න අපේ තාත්ති ආවා" මල්ලී ආලින්දයට දුවගියේ ඉතාමත් ප්‍රීතියෙනි. ගෙයි සිටි හැමදෙනම බයවූවාක් මෙන් මල්ලී ගිය දෙස බලා සිටියහ. මල්ලී නොපෙනී යනතෙක් බලාසිටි මා නැවත හිසහැරවූ විට සුදු අක්කාගේ ඇස්වල කඳුලු පිරී තිබෙන බව දුටුවෙමි. ලොකු කඳුලු කැට දෙකක් අක්කාගේ දෙකම්මුල් දිගේ රූරා හැලුනි. මා අම්මා දෙස බැලුවේ තවත් අක්කා දෙස බලා ඉන්න බැරිවූ නිසායි. අම්මාගේ දෙකොපුල් දිගේද කඳුලු කැට බේරෙන සැටි දිටිමි. එහි උන් හැමදෙනාගේම නෙත් අග කඳුලු පිරී තිබුණි මුලු කාමරයේම මහත් සෝකී බවක් තිබුණි මට ඉන් පිටවී දුවන්නට සිත්විය. එහෙත් මගේ අඩි ශබ්දය මහ හඬින් ඇසේ දෝ යන බිය නිසා මට පා ඔසවා ගත නොහැකිවිය.

චූටි නැවත ආපසු දුවගෙන කාමරයට පැමිණියා. ඔහුගේ මුහුණේ රැඳි ප්‍රීතිය අතුරූ දහන්වී තිබුණා. "තාත්ති ආවෙ නෑ අම්මේ දූන් කොච්චර රෑ වෙලාද ?" මෙතෙක් පැවැති තද නිහැඩියාව ඉන් බිදුණා. මල්ලී අම්මාගේ මුහුණ දෙස බැලුවා අනතුරුව සුදු අක්කාගේත්, පුංචි අම්මාගේත්, මුහුණු දෙස බැලුවා. මල්ලිගේ පුංචි ඇස්දෙකේද කඳුලු පිරුණා ඔහු හඬ නගා කෑ ගැසුවේ නැගැ අම්මාගේ දෙදණ මත මුහුණ හොවාගෙන සෙමෙන් ඉකි බිඳින්ට වුනා වරින් වර ඔහුගේ පිට උස් පහත් වන සැටි මා දුටුවා. ඔහුගේ හැඬීම තද වේදනාවෙන් පෙලෙන්නෙකුගේ කෙඳිරියක් වැනි විය. අම්මාගේ කම්මුල් දිගේ ආ කඳුලු වලින් මල්ලිගේ පිට තෙත්වුන හැටි මට තවත් බලා සිටිය නොහැකිවිය. සුදු අක්කා කඳුලු පිසමින් කාමරයෙන් පිටවී ගියාය. මමද ඇ පසු පස ගියෙමි. සුදු අක්කා ඇගේ කාමරයට වැදී කොට්ටයට මුහුණ තදකරගෙන ඇඳ



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මත දිගාවුණිය. ඈ ශබ්දනගා ඉකිබිඳින්ට විය දිනක් හේවිසි සමග මළමිණියක් අපේ ගේ ඉදිරිපසින් වැටුන පාර දිගේ ගෙන යනවිට "අන්න අපේ තාත්තා ගෙනියනවා මටත් බලන්න ඕනෑ"යි මල්ලි පොළොවේ ගැපෙමින් හැඬූ හැටි මට මතක් විය. හරියටම අවුරුද්දකට ඉස්සර මේවාගේම දිනක තාත්තා පෙට්ටියක් තුල දමා සාලය මැද තබා තිබුණ හැටි මට මතක්විය චූටි මල්ලී හැඬුවේ තාත්තා ඉතින් කවදාවත් නොඑන බව නිශ්චය වශයෙන්ම දැන ගෙනද නැත්නම් අනික් අය හැඬුව නිසා දැයි මම නොදනිමි. එදා තාත්තා දෙනෙත් පියාගත්තේ නැවත කවදාවත් අප දෙස නොබලන්ට බව මට මතක්විය. කාමරය වසා පැතිර සිටි අඳුරෙහිම මගේ දෑසුත් කඳුළින් පිරීයනු මට දැනින. තාත්තා මිය ගිය දිනයේ මෙන්ම සෝකී භාවයක් මුලු ගෙදරම රැඳී තිබුණි.

"සුදු අක්කා"

*Lyon Café*

*for people of*

*Good Taste*

Phone 7073 KANDY.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# සැනසුම

ගම් වැදුනු
හා පැටවෙකු පස්සේ
ගිනි පුලිඟු නෙතින් නහා
මාරක දත් විලිස්සමින්
දිව එන බලු රැලක් වගේ
මා එලවා
මා පස්සේ
දිව එයි ජීවයේ හැඟුම්

හැංගෙන්නට තැනක් නොමැත,
බේරෙන්නේ කෙලෙසද මම ?

මරණ බියෙන් පණ ගැන්වී
හදවත
දෑතට අරගෙන
නහර තුලම රත් ලේ මුදවා,
ගොරෝසු අඳුරෙහි කුසයෙන්
එළියට බට රිදී නිහඬ
සැනසිල්ලේ වැතිර සිටින, සන වනයට
දුවමි, දුවමි, පසු නොබලා.

සැනසුමේ පුළුන් තොටිල්ල
හමුවේවිද මෙහිදීවත් මට ?

සන වනයේ
ඝැඩි දෑඩි ගස් අතරින්
පඳුරු අතරින්, අඳුරු මැද්දෙන්
මීයෙකු දුටු ගැරඬියෙක් වගේ
කැරකී කැරකී, පෙරළී පෙරළී
බඩගා ගෙන එන්න දඟලයි
කිරුම් හඬ, බලු රැලේ

විමල් දිසානායක



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නූතන සිංහල කවිය හා විචාරකයා

සමාජයේ කෙරීගෙන යන යම්කිසි ව්‍යාපාරයක් ගැන එහි සාමාජිකයන් විසින් නිතරම කතා කෙරේ නම්, ඔවුන් ගේ අදහස් පැවසේ නම් එය, ඒ ව්‍යාපාරය සමාජයේ දැඩි සැලකිල්ලට භාජන වී ඇති බව පමණක්ම නොව එම ව්‍යාපාරයේ දියුණුවද හෙළි කරන්නකි. නූතන සිංහල කවිය ගැනද නොයෙක් දෙසින් පැවසෙන දේ කුමන තරාතිරමක ඒවා වුවද හුදෙක් ඒ ගැන අදහස් ප්‍රකාශ කිරීම පමණක්ම සිංහල කවියේ දියුණුවට ලකුණකි. විවේචන ග්‍රන්ථ, සඟරා, පුවත්පත්, සාහිත්‍යරැස්වීම් ආදී නානාවිධ මාර්ගවලින් පැවසෙන මේ අදහස් පරීක්ෂා කොට බලන්නෙකුට ඒවා විවේචන, පූරසාරම්, ඇණුම් බැණුම්, අදෝනා, තර්ජන ආදී වශයෙන් නොයෙක් කොටස්වලට බෙදිය හැකිය. ඒ කෙසේ වතුදු සිංහල උගතුන්ගේද, සිංහල හා තවත් භාෂා හැදෑරීමෙන් තම අත් දැකීම් වඩාත් පුළුල්කොට ගන්නට උත්සාහ කරන්නන්ගේද සැලකිල්ලට භාජන වී ඇති ප්‍රධානතම සාහිත්‍යමය අංගයක් වශයෙන් නූතන සිංහල කවිය හැඳින්විය හැකිය.

දැනට ලියැවී ඇති නූතන සිංහල කවි බොහොමයක් ම ඉතා දුර්වල රචනායැයිද, ඒ කවි දුර්වල වන්නට එක් ප්‍රබල හේතුවක් වූයේ සම්ප්‍රදායානු ගත එළිසමය රැකීමටත්, තමන්ගේ කවි එක් විරිතකට සීමා කිරීමටත් අපගේ නූතන කවියන්ද පෙළඹීමයැයිද යන සහේතුක මතයක් සිංහල පාඨක ජනයා තුළ වැඩෙමින් පවතියි. ගතානුගතික එළිවැටින් හා විරිතින් නිදහස් වූ පද්‍ය මාර්ගයක් වන නිසඳැස් කවිය උපයෝගී කැර ගැනීමෙන් නූතන සිංහල කවියේ දියුණුවක් සැලසිය හැකිය යන්න ඔවුන්ගේ විශ්වාසයයි.

මේ අතර මේ මතයට විරුද්ධව නැගී සිටින පිරිසක්ද සිංහල පාඨක ජනයා අතර සිටිති. මොවුන්ගෙන් සමහරෙක් කවි ගෙතීමෙහි ශූර කවියන් වන අතර බොහෝදෙනෙක් නූතන සිංහල කවියේ ආත්මය එළිවැට හා විරිතයැයි අදහන්නෝ වෙති. නූතන සිංහල කවිය ඉතා රසවත් එකක්ය, එළිසමය හා විරිත නොතකා හැරියහොත් වන්නේ සිංහල කවිය නැත්නටම නැතිවී යාමක්ය යන මතය හිසින් දරණ ඔවුහු, කවිය කියන්නේ 'රසය ආත්මය කොට ඇති වාක්‍යකට යැ'යි පැරැන්නන් කියූ කියුමද අමතක කරති. කවියක් ගොතා ගන්නට නොදන්නන් කවියන් වීමේ අදහසින් එළිසම කවිය විනාශ කොට නිසඳැස් කවියක් ඇතිකරලීමට උත්සාහ ගතිතැයි යන දෝෂාරෝපනයද නූතන සිංහල කවියේ දියුණුව උදෙසා නිසඳැස් කවිය උපයෝගී කරගත යුතුයයි කියන



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විචාරකයින්ට විරුද්ධව නඟා ඇති පවත් තර්කයකි. මෙතෙක් ලියැවී ඇති, ජී. බී. සේනානායක, සිරි ගුණසිංහ, ගුණදාස අමරසේකර ආදීන්ගේ නිසඳැස් කවි, කවි නොව නිකම්ම පද්‍ය හැලියැයි සිතාවට ලක් කිරීමට ඔවුහු උත්සාහයක් ගනිති. මෙය විචාරශීලි වූවක් නොවේ. (The Figures of Speech and Figures of Thought) යන ග්‍රන්ථයෙහි සාහිත්‍ය විවේචනය අරභයා ආනන්ද කුමාරස්වාමි ගේ එක් කියුමක් බොහෝ කලකට පෙර කියන ලද්දක් නමුදු එය මෙකලට ද ඉතා හොඳින් ගැළපෙතැයි සිතේ.

"යම්කිසි විචාරකයෙකු, හොඳනරක අනුව හෝ වේවා, චමත්කාරයට අනුව හෝ වේවා හුදෙක් තමා තුළ හෝ සමාජයේ හෝ මුල්බැසගෙන ඇති රසාස්වාදන ක්‍රමයන්ට අනුවම යම්කිසි කෘතියක අගය මනින්නට යත්තේ නම් එය සාහිත්‍ය විවේචනයක් නොවේ යයි නියත වශයෙන්ම කිව හැකිය"

මෙසේ හෙයින් එළිසමය නොමැති පමණින්ම කවියක් හෙළා දැකීම සාහිත්‍ය විවේචනයැයි කිව නොහැකිය. කවිය පමණක්ම නොව අන් හැම කලා කෘතියක්ම විවේචනය කරන විචාරකයා තුළ පිහිටිය යුතු ගුණ වලින් උපේක්ෂාව වූ කලී උතුම් එකකි. යම් යම් බාහිර හේතූන් නිසා තමාට හිත වැටී ඇති යම්කිසි සාහිත්‍ය කෘතියක් අසාර්ථක එකක් නම් එය අසාර්ථක එකක් සේ පාඨක ලොවට පෙන්වා දීම විචාරකයාගේ යුතුකමකි. එසේම යම්කිසි කරුණු නිසා තමන් කැමති නොවන යමකිසි කෘතියක් සාහිත්‍ය කෘතියක් ලෙස සලකා බලන කල්හි උසස් එකක් සේ විවේචකයාට දැනේ නම් එයද සමාජයට හඳුන්වාදීම ඔහුගේ පරම යුතුකමක් වන්නේ ය. ජනප්‍රිය නොවන කවියකු ප්‍රශංසා කරන්නටත්, ජනප්‍රිය කවියකු ගේ දොස් පෙන්වා දෙන්නටත් සමහර විට විවේචකයාට සිදුවෙයි. මේ දුෂ්කර කාර්යය සඳහා කෙලෙස් දමනය කළ එකකු තුළ පිහිටිය යුතු තරමේ උපෙක්ෂාවක් විවේචකයකු තුළ පිහිටිය යුතුය. අපක්ෂපාත විවේචකයා හඳුනාගන්නා සමාජය උසස් හෝ පහත් සාහිත්‍ය කෘති වෙන්කොට හඳුනා ගැනීමටත් උසස් කෘතීන් රසවිඳීමටත් ඔහුගේ සහාය පතයි. පාඨක සමාජය විචාරකයකු කෙරෙහි විශ්වාසය තබන්නේ ඔහු අපක්ෂපාතීව, උපේක්ෂා සහගතව සාහිත්‍යකෘතීන් විවේචනය කරන්නකු බව ඒත්තු ගිය හොත් පමණි. එමනිසා තමාගේ පුද්ගලික රුචි අරුචිකම්වලට අනුව හෝ, සමාජයේ මුල්බැසගත් මතයන්ට අනුව හෝ, තමාගේ රුචිය මුළු පාඨක ජනතාවගේම රුචියය යන දුර්මතය මත පිහිටා හෝ කරන සාහිත්‍ය විවේචන නිසා විශාල අපරාධයන් දෙකක් සිදුවෙයි. උසස් නිර්මාණයන් කරන කවියන් අධෛර්යමත්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වීම එක් අතකින් සිදුවන අතර, පක්ෂපාතීව කෙරෙන විවේචන නිසා සාමාන්‍ය පාඨකයා නොමග යැමද අනෙක් අතින් සිදුවෙයි. එමනිසා, එළිසමය හා විරිත අත්හැර ලියන කවි එළිසම කවියට වඩා කාව්‍ය රස උද්දීපනයට සමත් වෙතියි යන කියුමෙන් සිත් වේදනාවට පත්ව, යම් යම් කෘතීන් හෙළා දකින්නටත්, යම් යම් පුද්ගලයන් අන්ධ භක්තියකින් පුදන්නටත් තරම් සැහැසි වන ඇතැම් විචාරකයන් නිසා නූතන සිංහල කවියද එබඳු ඉරණමකින් ගලවා ගත හැකිවන්නේ, කවිය නම් මේය, කවියේ රසය නම් මේය, එළිසමයෙන් හා විරිතෙන් මිදුණු විට නූතන සිංහල කවියේ රසය වැඩිවන්නේ මේ ලෙසින්ය යන කරුණු සහේතුකව පාඨකයන් ඉදිරියෙහි තැබීමෙනි.

කවිය වූ කලී සහජ වාසනා ගුණවත්, ප්‍රතිභා ශක්තියත් ඇති කවියකු මෙතෙක් කිසිවකු නො පිවිසුණු චමත්කාර ජනක ලෝකයකට වැද එහි ඔහු විසින් දකින ලද අපූරු අත්දැකීම් වචන යන්ගේ මාර්ගයෙන් අපටත් දැනවීමෙකි කවි ලියන්නා ප්‍රථම වශයෙන්ම කවියකු විය යුතුය. කවිත්වයක් නොමැතිව රසවත් කවියක් නිර්මාණය කිරීම උගහට නෙයිනි. දෙවැනි වශයෙන් කවියා ගේ අපූරු අත්දැකීම් පාඨකයාට දැනවිය හැකිවන අන්දමේ වචන මාලාවක් ඔහු සතුවිය යුතුය. කවියා තමා සිතින් පිවිසුණු ලෝකයේ චමත්කාර ජනක අත්දැකීම් අපට දැනවීම උදෙසා උපයෝගී කරගන්නේ වචන පමණකි. කවියා ඔහුගේ අත්දැකීම් අපට හඟවන්නේ සිත්තම් ඇඳ නොවේ. හුදෙක්ම වචන ආශ්‍රයෙන් පමණි. මේ වචන ඔහු එකිනෙක ගැලපීමේදී වෘත්තය එතරම් වැදගත් නොවේ. ඔහු පද සකස් කරන්නේ ගී විරිතට අනුවද, සමුද්‍රඝොෂ වෘත්තයට අනුවද, එසේ නොමැති නම් නිසඳැස් කාව්‍ය සම්ප්‍රදායට අනුවද යන්න කවියක හොඳ නරක මැනීමේ කෝදුවක් කර ගැනීම අයුතුය. තමා මනසින් පිවිසුණු ලොවින් ආස්වාදයක් ලත් සිත්තරු ඒ ආස්වාදය අපට දනවන්නේ සිත්තමක් මගිනි. සංගීතඥයා ඒ රසය අපට දෙන්නේ කන් පිනවන වාදනයක් හෝ ගායනයක් මගිනි. කවියාද ඒ ආස්වාදය අපට දනවන්නේ වචන යන් එක්තැන් කොට කවියක් නිර්මාණය කිරීමෙනි. මිනිස් ලොවට අවශ්‍ය රසය කිනම් මගකින් හෝ සාර්ථකව නිෂ්පාදනය කරන්නා උසස් කලාකරුවෙකු කොට සැලකිය යුතුය. යම්කිසි කවියකු කුමන වෘත්තයකට අනුව හෝ කවි ලියා, ඒ කවි ආශ්‍රයෙන් අපගේ සිතෙහි චමත්කාරයක් ඇතිකරයි නම් ඔහුගේ කවිත්වය ගැන සැකයක් ඇතිකර ගත යුතු නොවේ. එළිසමයට හා විරිතට අනුව පබැඳුණු පමණින් යම්කිසි කෘතියක් කවියක් බවට පත් නොවේ. එය බැහැර කළ පමණින්වත් ඒ කෘතිය කවියක් බවට



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නො පෙරළේ. කාව්‍ය නියතාකාරයෙන්ම කවියක් වන්නේ කවියා තුළ ඇතිවුණු අපූර්ව සංකල්පනාවක් උචිත පදමාලාවක් ආශ්‍රයෙන් අසන්නාගේ සිතටද දැනවීමට සමත් වූ විට පමණකි.

උසස් ප්‍රතිභාසම්පන්න කවියකු තුළ අපූරු කවි සංකල්පනා ඇතිවීම ස්වභාවයකි. එනමුත් එය කවියට නැගීමේදී කවියා භාවිත කොට ගන්නා වචන මාලාවෙන් ඔහු තුළ ඇතිවූ ඒ අපූරු කවි කල්පනාව ප්‍රකාශ නොවේ නම් එය අසාර්ථක කවියක් වන්නේ ය. අනෙක් අතට, කෙතරම් හොඳින් එළිසමය යොදා විරිතකට අනුව බඳින ලද කවියක් වුවද ඒ කවියෙහි ගැබ්වන කවි කල්පනාවක් නොමැති නම් එයද කවියක් වශයෙන් සැලකිය නොහැක. උසස් කවි කල්පනාවකුත් එය ප්‍රකාශ කෙරෙන උචිත භාවික පදමාලාවකුත් කවියක අත්‍යවශ්‍ය අංගයෝ යි. අපගේ නූතන සිංහල කවියන්ගේ රචනා විමසන්නෙකුට ඉහත දැක්වුණු කරුණු ප්‍රත්‍යක්ෂ වෙතියි සිතේ. අපගේ නූතන කවියන් සමහරකු තුළ කවි කල්පනා නොනෙත්ම දක්නට නොලැබෙන අතර, සමහර කවියන් තුළ කවියකු කෙරෙහි තිබිය යුතු සහජ කුසලතාවන් තිබෙන බව ඔවුන්ගේ සමහර කවි කියවන විට හැඟී යන කරුණකි. එසේ නමුදු ඔවුන් තුළ ජනිතවුණු ඒ අපූරු සිතුවිලි ප්‍රකාශ කිරීමට ගත් මාර්ගය, එනම් විරිතටත්, එළිසමයටත් අනුව බැඳුණු කවි නිසා ඔවුන්ගේ ඒ ප්‍රයත්නයන් අසාර්ථක වී ඇත. ඔවුන්ගේ ඒ නිදහස් කවි කල්පනා ප්‍රකාශ කිරීමෙහිලා එළිසම කාව්‍ය අපොහොසත් වී ඇත්තේ එය, එළිසමය, විරිතය ආදී විසින් නීතිරීති කීපය කට බැඳී සිටින හෙයිනි. කවියාගේ සිතුවිලි නිදහසේ ගලායන්නක් වන හෙයින්, ඒ සිතුවිලි අපට දැනවීමට ඔහු විසින් උපයෝගී කොට ගන්නා පදමාලාවත් නීතිරීතීන්ට නොබැඳුණු නිවහල් එකක් විය යුතුය. උසස් ප්‍රතිභාශක්තිය ඇති කවියකු තමන්ගේ කවි කල්පනා අපට දැනවීමේ මාධ්‍යය වශයෙන් නිසඳැස් කාව්‍ය ප්‍රවේස මෙන් උපයෝගී කර ගන්නේ නම් නූතන සිංහල කවියේ දියුණුව එයම වනු ඇත. මෙතෙක් අපට දකින්නට ලැබී තිබෙන සමහර නිසඳැස් කවිවල මේ දියුණුවේ ලකුණු දැනටමත් දකින්නට තිබේ. එළිසම කවිද, නිසඳැස් කවිද කියවා ඒවායේ රසයක් ඇතිනම් විඳගෙන, ඒවායේ යම් නිරස බවක් දක්නට ඇත්නම් ඒ නිරස බවට හේතුවූ කරුණු උපේක්ෂාසහගතව පිරික්සා බලන්නෙකුට, නූතන සිංහල කවියේ රස උද්දීපනය කිරීමේදී මෙබඳු බාධක තිබේය, එබඳු බාධක මග හරවාගෙන උසස් නූතන සිංහල කවි කලාවක් ඇති කළ හැක්කේ මේ ලෙසින්ය යන්න වටහා ගැනීමට අපහසුවක් වෙතැයි නොසිතමි.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කවිය වූ කලී කවියා වචනයන්ගේ උපකාරයෙන් කරන රස උත්පාදනයකි. ඔහුගේ සිතෙහි ජනිත වන හැඟීමක් කියාපෑම සඳහා ඉතාමත්ම උචිත වචන තෝරා බේරා ගැනීමේ නිදහසක් කවියා සතුවිය යුතුය. තමාගේ කවි සංකල්පනාව ප්‍රකාශ කිරීමෙහිලා උචිතයැයි තමාට හැඟෙන වචනයක්, එළිසමයට ගැනී වීම නිසා හෝ, වෘත්ත රැකිය යුතු නිසා හෝ අනක්කොට වෙනත් වචනයක් යෙදීමට කවියා පෙළඹුණහොත් එය මහත් වරදකි. තමන්ගේ කවි කල්පනා කවියට නැඟීමෙහිදී නූතන සිංහල කවියන් බොහෝදෙනෙක්ද මේ ප්‍රශ්නයට මුහුණ පා සිටිති. නිදහසේ තෝරා ගන්නා ලද වචන මාලාවකින් චමත්කාර ජනක හැඟීමක් ප්‍රකාශ කරනු වෙනුවට අපේ බොහෝ කවියන් පෙළඹෙන්නේ එළිසමයට හා වෘත්තට ගැලපෙන වචනයන් යෙදිය හැකිවන පරිදි තම සිතුවිලි පාලනය කර ගැනීමටය. වෘත්ත විසින් හෝ වේවා, එළිසමය විසින් හෝ වේවා වෙනත් කුමන බාහිර හේතුවක් නිසා හෝ පාලනය කරනු ලැබූ කවි කාල්පනික සිතුවිල්ලක් රසවත් කාව්‍යමය ස්වරූපයකින් බිහිනොවෙයි. ඒ වෙනුවට අපට දකින්නට ලැබෙන්නේ සක්ක පදවලින් හා අනවශ්‍ය වචනවලින් පිරුණු හතර පද පමණකි

| | |
|---|---|
| අත් පොඩි දෙකාසා සියුමැලි බව නෙලට | දූනී |
| උණුසුම් හැඟිමක් හදවත වැලඳ | ගනී |
| එකෙණෙහි ආදරය පෙළහර නඟනු | වැනී |
| සංගීතයක් තොල් අතරින් බිමට | පනී |

මේ කවියෙහි 'එකෙණෙහි' 'වැනී' යන පද කුමන කාර්යයක් ඉටු කෙරේදැයි අප විසින් විමසා බැලිය යුතුය. මෙබඳු අනවශ්‍ය පද ඇතුළුවීම නිසා කවියෙහි රසය කෙලෙසෙයි. ඒ අතරම කවියෙහි ඇති මටසිලුටු බවත්, ලුහුඬු බවත් නැතිවී යෙයි. 'එකෙණෙහි' යන පදය මෙහි පාවිච්චි කරන ලද්දේ හුදෙක් වෘත්තය රැකීමට විනා කවියාගේ හැඟීම් ප්‍රකාශනයට ඒ පදය අවශ්‍ය වූ නිසා නොවේ. ඒ හැරත්, මෙහි එන 'ආදරය පෙළහර නඟනු' යන යෙදුම රස උද්දීපනය කරන්නක් නොවේ. වාච්‍යාර්ථයෙන්ද ව්‍යංගාර්ථයෙන්ද තොර එබඳු පද කවියකට වැද්ද නොදුන මනාය.

'සංගීතයක් තොල් අතුරින් බිමට පනී' එළිසමය නිසාත් වෘත්තය නිසාත් අපේ නූතන සිංහල කවියකු මෙතැනදී කෙතරම් නොමග ගියේද යනු කිවහොත්, 'සංගීතය' 'බිමට පනින' බවක් කීමට පවා එඩිතර විය. එම අව්‍යක්ත යෙදුම කවියට පිවිසුණේ 'නී' යන්නෙන් කෙළවරවෙන ලෙස හතර පදය පිරවීමට අපගේ කවියාට අවශ්‍යවූ හෙයිනි. කවියා මෙසේ අසාර්ථක රචනාවක්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිරීමට පෙළඹුණේ ඔහුගේ කවි කල්පනාවල දුර්වල කමටත් වඩා සම්ප්‍රදායානුගත එළිසමය හා විරිත රැකීමට ගන්නා ලද උත්සාහය නිසාය. එළිසමය හා විරිත කවියාගේ නිදහස සීමා කරන බැමි ලෙසින් හඳුනා ගත යුතුය.

කවියක, එහි රස නිෂ්පත්තියට අනවශ්‍ය එක් වචනය කුදු නොතිබිය යුතුය. උපයෝගී කරගන්නා වචන වලින්ද, වාච්‍යාර්ථය, ව්‍යංගාර්ථය හා ධ්වනිය ආදී සැම ප්‍රයෝජනයක්ම ගැනීමට කවියා සමත් විය යුතුය. කවියේ වචන ගණනින් සුළු වුවද ඒ වචන ආශ්‍රයෙන් අසීමිතවූත්, ගැඹුරුවූත් කල්පනා ලෝකයකට පාඨකයා ඇතුළු කරවිය හැකි වන්නේ නිදහස් චින්තනයට මෙන්ම, නිදහස් ලෙස බස හැසිරවීමට අවකාශයක් ලබන කවියා විසින් පමණකි. එළිසමය හා විරිත මෙබඳු අවකාශයකට ඉඩ නොතබන අතර එබඳු දැඩි නීතීන්ගෙන් මිදුණු නිසඳැස් කවිය එයට අවශ්‍ය නිදහස් කවියාට ලබා දෙයි.

ගල් ගුහාවකින් අඳුරේ
එළියට එන දිළිහි දිළිහි
හොඳුරු සොයන ඇස් වාගේ
මා සිත තුල පෙරළි පෙරළි
දඟලය දහසක් දේවල්

මෙතැන්හිදී කවියා උපයෝගී කොට ගත් හැම වචනයක්ම කවියේ රස නිෂ්පාදනයට අත්‍යවශ්‍යවෙයි. කවියේ රසයට හානියක් නොකොට එක් වචනයක් හෝ කවියෙන් ඉවත් කළ නොහැකිය. 'ගල්ගුහාවකින්' හා 'අඳුරේ' මන පදවලින් ධ්වනිත කෙරෙන අඳුරු පසුබිමින් පසුව අපට පෙනෙන්නේ දිළිසෙන ඇස් දෙකකි. 'දිළිහි දිළිහි' යන්නෙන් ඒ ඇස්වල රෞද්‍රතාව අපට ඇඟවෙන අතර 'ගොදුරු සොයන ඇස්' යන යෙදුමෙන් අපට දැනෙන්නේ ඒ මේ අත හැරෙන ඇස් දෙකකි. සිතුවිලි නිසා කවියා විඳින වේදනාවද භීතියද මේ කවියෙන් මනාව ප්‍රකාශ වෙයි. ප්‍රවේසමෙන් හා කිසිම නීතියකට වහල් නොවී ගලපන ලද කවියකින් අසීමිතවූ රසයක් මතුකළ හැකිායයි මා කීවේ එහෙයිනි. කවිය අඛණ්ඩ ප්‍රවාහයක් සේ කවියාගේ මුවින් නොගිලිහෙයි. ඔහු වචන තෝරාගන්නේ, ඒ වචන තමාගේ කවියට වැද්ද දෙන්නේ කීපවරක් වචන ගැන හැඟීමෙන් පසුවය එසේ සිතන ඔහුට තමාගේ කවි කල්පනාව ප්‍රකාශ කිරීමට ඉතා උචිත වන්නේ මේ මේ වචනයැයි තීරණය කරගත හැකිවෙයි. එනමුත් එළිවැට හා විරිත විසින් කවියෙහි පදමාලාව මෙහෙයැවේ නම්, කවියට ඉතාම සුදුසුයැයි කවියාට සිතෙන වචනය අත්හැර වෙනත් වචනයක් යෙදීමට බොහෝ විට



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඔහුට සිදුවෙයි. නූතන සිංහල කවියේ නිරස බවට එක් ප්‍රධාන හේතුවක් වී ඇත්තේ එයයි.

යම්කිසි කවියක් කියවීමෙන් පසුව අප සිතෙහි රසයක් ඇති වන්නේ කවියා විසින් තමාගේ හැඟීම් ප්‍රකාශනයෙහිලා උපයෝගි කර ගන්නා ලද පදමාලාව ආශ්‍රයෙනි. කවියාගේ සිතෙහි කොතරම් අපූරු සිතුවිල්ලක් තිබුණත් එය සාර්ථක අන්දමින් පාඨකයාවද දනවන්නට ඔහු සමත් නොවේ නම් ඒ කවියා දක්ෂ කවියකු සේ නොසැලකිය යුතුය. කවියා සිය කාව්‍ය රචනයේදී පාඨක ලෝක යක්ද ඇති බැව් සිහිකළ යුතුය. නිතරම පාඨකයා ගැන සලකා මේ ලෙසින් මගේ පද යෙදුව හොත් කවිය කියවන්නා තුළ රසවත් හැඟීම් ගට ගනීය යන හැඟීමෙන් යුතුව කවියා සිය රචනයන් කළ යුතුය. කවියා තුළ වචන ගැන හැඟීමක් තිබිය යුතුය. යම්කිසි භාෂාවක වචන පරිහරණය හොඳින් හැදෑරුවකුට ඒ ඒ වචන ඒ ඒ තන්හි යෙදීමෙන්, ඒ ඒ පද හා සමග සංඝටනය කිරීමෙන් නොයෙකුත් රසවත් හැඟීම් ජනිත කරවිය හැකිය.

දෙනෙතත් ඉඟිමරා සතුටින් ඉපිල්ලෙමින්
සිහින් මුතුවූ දත් පෙන්වා මහත් හඬින්
රිදී කාසි සොලවන මෙන් සිනාසෙන
නිමල් යුවතියේ මිහිරිසි ඔබේ හඬ

මෙහි දක්නට ලැබෙන වචන තෝරා ගැනීමෙහිදී කවියා කිසිම නීතියකට බැඳී නොමැත. 'දෙනෙත් ඉඟිමරා', 'සිහින් මුතුවූ' 'නිමල් යුවතියේ' වැනි යෙදුම් වල ඇති සරල බවත්, රසවත් බවත් කියවන්නාගේ සිතටද එක්වරම දැනෙයි. 'රිදී කාසි සොලවන මෙන් සිනාසෙන' මේ පදයේ නිතැතින්ම මෙන් යෙදී ඇති 'ස' කාරය නිසා යුවතියක් මිහිරි හඬින් සිනාසෙනු පාඨකයාගේ කණට ඇසෙන්නාක් මෙන් සමහර විට දැනෙයි. වචන තෝරා ගැනීමෙහි දීත් ඒ වචන රිසිසේ අනෙකුත් වචනයන් සමග ගැලපීමේදීත් කවියා එළිසමයට හෝ විරිතට නෝ වහල්නොවීම නිසා ලත් නිදහස මේ කවියෙන්ද පිළිබිඹු වෙයි. අනුචිත වචන මෙන්ම, අනුචිත පද සංඝටනයද කවියක රස නිෂ්පත්තියට අතිශයින්ම හානිකරය. එළිසමයෙන් හා විරිතෙන්ද මිදුණු දක්ෂ කවියකු අතින් මේ වරද කෙරෙන්නේ කලාතුරකිනි. කවියා තුළ ඇතිවුණු චමත්කාරය කවියට නැගීමෙහිදී එයට අතිශයින්ම උචිත වචන තෝරාගෙන කවියේ ලාලිත්‍යයට ගැලපෙන අයුරින් ඒ පද යෙදීමෙන් පාඨකයාට සිතෙහි අපූර්ව රසයක් ඇති කරවිය හැක්කේ නිසඳැස් කවිය මගින් පමණකි. එළිසමය විසින්ද, විරිතට අවශ්‍ය මාත්‍රාගණන විසින්ද



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සීමා කරනු ලැබූ චින්තනය ඇති කවියකු අතින් ලියැවෙන කවියක මෙබඳු ප්‍රාතිහාර්යයක් බලාපොරොත්තු විය නොහැක.

නූතන සිංහල කවියේ දියුණුව රඳා පවතින්නේ එළිසම කවිය මතය, එසේ නැත්නම් නිසඳැස් කවිය මතය ආදී වශයෙන් මත භේදයක් පවතින මෙකල අප විසින් නිවැරදි මග තෝරා ගත යුත්තේ එළිසම කවියත්, නිසඳැස් කවියත් දෙස විචාරාත්මකව බැලීමෙන් පමණකි. කවිය වූකලී කවියකු විසින් තම සිතෙහි හටගත් අපූරු සිතුවිල්ලක් වචනයන්උප යෝගී කොට ගෙන අපටත් දැනවීමට ගන්නා ලද උත්සාහයකි. කවියාගේ ඒ සිතුවිල් ලට ගැලපෙන වචන තෝරා ගැනීමටත්, ඒ වචන රිසිසේ ගැලපීම ටත් කවියාට නිදහස තිබිය යුතුය. ඒ නිදහස එළිසමය හා විරිත නිසා ඇහිරී යන අයුරු අපි දුටිමු නිසඳැස් කවිය උපයෝගී කොට ගන්නා කවියාට එබඳු අවහිරයක් සිදු නොවේ. එසේ හෙයින් සිංහල පාඨකයා රස කවියෙකු වන්නේ නම් ඔහු නිසඳැස් කවියේ අගය වටහා ගත යුතුය.

එළිසම කවියේත් නිසඳැස් කවියේත් හොඳ නරක විමසීමට බසින විචාරකයා සමාජයේ මූල්බැසගත් තීරණයන්ට අනුව හෝ තමා විසින් එක් පක්ෂයක් පමණක් සලකා බැසගත් තීරණයන්ට අනුවම තම සිතුම් මෙහෙයවතොත් එය විචාරයක් නොවන්නේය. මනුෂ්‍යයකු වශයෙන් හා පාඨකයකු වශයෙන් තමා ලත් අත්දැකීම් මත පිහිටා උපෙක්ෂාසහගතව කරන විවේචනයම නියම විවේචන යක් වන්නේය.

ආර්. ඇස්. ජයරත්න



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# විශ්ව විද්‍යාලය හා දේශපාලනය

ලංකා විශ්ව විද්‍යාලය ගැන යම් තැනෙක සඳහන් කෙරෙතොත් එයින් මහජනයා අතර ධ්වනිත වන අරුත් දෙකෙකි. සංස්කෘතිය කට නැකමක් නොකියන සලෙලුන් මෙන් හැසිරෙන ම්ලේච්ඡ පිරිසක් වෙසෙන මහා හෝටලයක් යන්න පළමු අරුතය. ඒ විශ්ව විද්‍යාලය පිළිබඳව පුවත් පත් මගින් මහජනයා තුළ ඇති කරන ලද මත යයි. තරුණ මොළ වලට වාමාංශික අදහස් කාවද්දන ආකරයක් යන්න දෙවැනි අරුතය. විශ්ව විද්‍යාලය පිළිබඳව මෙවැනි හැඟීම් මහජනයා තුළ ඇතිවූයේ මොන හේතූන් නිසා දැයි විග්‍රහ කොට දක්වීමක් මෙම ලිපියෙන් අදහස් නොකෙරේ එහෙත් විශ්ව විද්‍යාලයේ දේශපාලන අදහස් ගැන සලකා බලන විට විශ්ව විද්‍යාලය ගැන මෙවැනි මතයක් ඇතිවීම පුදුමයක් කොට සැලකිය නොහේ.

යම් යම් හේතූන් කරණ කොට ගෙන විශ්ව විද්‍යාලය පේරාදෙණියට ගෙන ඒමත් සමගම එහි වූවන් තුළ වාමාංශික දේශපාලන අදහස් වර්ධනය වන්නට විය. සමහර විට මෙය මෙසේ වූයේ ඇදුරන්ගේ ඊට ලැබුණ සහයෝගය නිසා විය හැකි ය. විශ්ව විද්‍යාලය පේරාදෙණියට ගෙන ඒමට කලින් විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් දේශපාලන අදහස් නොදැරූ අය බවක් මෙයින් නොහැඟේ. එහෙත් විශ්ව විද්‍යාලය පේරාදෙණියට ගෙන ඒමත් සමගම වඩාත් සංවිධානාත්මකව දේශපාලන කටයුතු ගෙන යැමට නේවාසික විශ්ව විද්‍යාලයක පරිසරය ඉතා සුදුසු විය. විශ්ව විද්‍යාලයීය ශිෂ්‍යයන් මාර්ක්ස් වාදීන් හැටියට මෙසේ හංවඩු ගැසුනද මාර්ක්ස් වාදය කුමක් දැයි පවා හරි හැටි දැන සිටියේ ඔවුන්ගෙන් ඉතා ස්වල්ප දෙනෙකු පමණි. තමා මාර්ක්ස් වාදියෙකැයි පුරසාරම් දෙඩීම විශ්ව විද්‍යාලයීය ශිෂ්‍යයෙකුට මහත් ආඩම්බරයක් විය. විශ්ව විද්‍යාලයීය ශිෂ්‍යයන් අතර මාර්ක්ස් වාදය කොතරම් අජීර්ණ වීද යත් ඊට විරුඬව කථා කිරීමට පවා ඔව්හු මැළිවූහ. මාර්ක්ස් වාදීන්ට විරුඬව සටනක් ගෙන යැමට කවරෙක් වත් ඉදිරිපත් නොවූහ. විටින් විට පැවැත් වුණු නිවාසීය හා සමිති සමාගම් නියෝජිතයන් තෝරීමේ තරඟයන් හිදී මෙය නොදින් පැහැදිලි විය

තරුණු මෙසේ වූයෙන් කල්පනාකාරි දෙමාපියෝ තම දරුවන් විශ්ව විද්‍යාලයට එවීමට පවා තරමක් අකමැත්තක් දැක්වූහ. විශ්ව විද්‍යාලයට ගියහොත් "කොමියුනිස්ට් කාරයකු" නැතහොත් සමසමාජ කාරයකු වීම නියතය යන මතය එතරම්ම තදින් මුල් බැස තිබුණ හෙයිනි. විශ්ව විද්‍යාලය යන්න මතක් කළ පමණින්ම සමහරුන්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුළ පිළිකුලක් ඇතිවන්නේ එහි වූ වත් මහා විප්ලව කාරීන් යැයි හංවඩු ගසා තිබුණ හෙයිනි.

විශ්ව විද්‍යාලයයේ දේශපාලන භූමිය වාමාංශිකයන්ටම සීමා වුවද මේ වාමාංශිකයන් අතර ප්‍රභේද දෙකක් විය. කොමියුනිස්ට් හා සමසමාජ යනුවෙනි. මෙම දෙ කොටස ප්‍රබල වන්නට ප්‍රබල වන්නට ඔවුන් අතර වූ අසමගියද දියුණු වන්නට විය. දිවයිනේ මෙම දෙපක්ෂය අතර කුලල් කා ගැනීම් දක්නට නො ලැබුණ ද විශ්ව විද්‍යාලය ඇතුලත ඔවුන්ගේ සට්ටන විශාල විශයෙන් දක්නට ලැබිණ. කොමියුනිස්ට් කණ්ඩායමේ මෙහෙයීමෙන් පවත්වන රැස්වීම් කඩා කප්පල් කිරීමට සම සමාජ කණ්ඩායම තැත් කළ අතර සම සමාජ මෙහෙයීමෙන් පැවැත්වූ රැස්වීම් කඩා කප්පල් කිරීමට අනෙක් පිරිස තැත් කළහ. සමහර අවස්ථාවන් හි දී ගෙන්වනු ලැබූ කථික යන් පවා මෙම ප්‍රභේද මුල් කොට ගෙන කථා කළ බව පෙනේ. "සම සමාජ කාරයන් ගේ දවල් හීන" යනුවෙන් තිස්ස විජේරත්න මහතා පැවැත්වූ කථාව මෙහිදී සඳහන් කළ හැකිය. නිවාසීය නියෝජිතයන් තේරීමේ තරඟයන් හි ද මෙම කණ්ඩායම් දෙක නිතර කුලල් කා ගත් සැටි හොඳින් ප්‍රත්‍යක්ෂ විය. මෙම වාමාංශික කොටස් දෙකින් ප්‍රබල වූයේ කිනම් කොටසද යනු නිගමනය කිරීම තරමක් අසීරුය. විටෙක සම සමාජ කොටස බල සම්පන්න ලෙස පෙනුණ ද තවත් අවස්ථාවක කොමියුනිස්ට් වරු බලසම්පන්න සේ පෙනිණ. මෙතැනදී තවත් කරුණක් පැහැදිලි කළ යුතු ය. වාමාංශික කණ්ඩායම් දෙකටම නො අයත් වූ පිරිස සාමාන්‍යයෙන් අපූරු ප්‍රතිපත්තියක් අනු ගමනය කළහ. වඩා බල සම්පන්න ලෙස පෙනුණු කොටසට විපක්ෂවීම මොවුන්ගේ සිරිත විය කොමියුනිස්ට් වරු බල සම්පන්න වූ විටෙක ඔවුන් ඡන්දය දුන්නේ සම සමාජ කණ්ඩායමට ය. නො එසේ වූ විට කොමියුනිස්ට්වරුන්ට ය.

දේශපාලන තත්ත්වය මෙසේ වූයෙන් වාමාංශිකයන්ට විරුද්ධව නැඟී සිටීමට කවුරුත් ඉදිරිපත් නො වූහ. සමහර විට කිසිවෙක් එවැනි පියවරක් නොගත්තේ ඊට ලැබෙන සහයෝගයක් නොමැතියි සිතූ නිසා විය හැකි ය. මෙසේ ම මෙම වාමාංශික පක්ෂ කොතරම් සංවිධාන වීද ප්‍රබල වීද යත් කීය සැක නො මැතිව ප්‍රසිද්ධියේ ම තම ශක්තිය පෙන්වන්නට වූහ. කරුණු මෙසේ වුවද විශ්ව විද්‍යාලයයේ දේශපාලන තත්ත්වයෙහි විශාල විපර්යාසයක් ඇති වීමට තුඩු දුන් විශේෂ සිද්ධියක් පසු ගිය වසෙහිදී සිදු විය සම සමාජ කණ්ඩායම තම ශක්තිය උරගා බැලීමක් වශයෙන් විශේෂයෙන්, විශ්ව විද්‍යාලයයේ සම සමාජ ආධිපත්‍යය මහජනයාට පෙන්වීමට මෙන් සිංහල පනත හෙළා දැකීමේ යෝජනාවක් ශිෂ්‍ය සංගමය ඉදිරියට ගෙන ආහ. මෙම යෝජනාව ඉදිරිපත් කළ අවස්ථාවෙහි දී



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සරසවිය තුළ නොයෙකුත් නොසන්සුන් කම් ඇති විය. සිංහල පනත සාධාරණ හෝ අසාධාරණ හෝ වේවා, හැඟීම් කුපිත කරවන, ශිෂ්‍යයන් අතර භේද භින්න කරවන මෙවැනි යෝජනාවක් ශිෂ්‍ය සංගමයට ඉදිරිපත් කිරීම යෝග්‍ය නොවන බව දුන් නම් යෝජනාව මෙහෙය වූ අයට පවා පැහැදිලි විය යුතුය. රටේ නොයෙකුත් ජාති භේද ඇති වුවද සුළු පාක්ෂිකයන් රැසක් වෙසෙන මෙම විශ්ව විද්‍යාලයෙහි එවැනි කිසිදු ලකුණක් පහළ නොවීය. කරුණු එසේ වූ විට මෙ වැනි වැදගම්මකට නැති යෝජනාවක් ඉදිරිපත් කිරීම විශ්ව විද්‍යාලය තුළටත් මේ ජාති භේද ගෙන ඒමට කරන ලද උත්සාහයක් හැටියට හැඳින්වීම නොවටී ද? කෙසේ හෝ වේවා යෝජනාව ඉදිරිපත් කළ අවස්ථාවේ දී කොමියුනිස්ට් අනුගාමිකයන් ගේ සහයෝගයද එයට ලැබිණ නොයෙක් අවහිරයන් මධ්‍යයේ යෝජනාව සම්මත විය. එහෙත් මෙතෙක් තැනින් තැන විසිර ගිය වාමාංශි විරෝධීන් ප්‍රථම වරට එක් තැන් වූයේ මෙම අවස්ථාවේ දී බව පෙනේ. යෝජනාවට පක්ෂව ලැබුණේ ඡන්ද 453 ක් පමණි. මේ සම සමාජ කොමියුනිස්ට් මූළු බල ඇණියම එක මුතුව, සිංහල පනතට විරුඬ අතිකුත් අයගේ ද සහාය ලබා ගැනීමෙන් ලබා ගත් ඡන්දය මෙයින් වැදගත් කරුණක් අනාවරණය විය වාමාංශික පක්ෂයන්ට අයත් නොවන විශාල පිරිසක් විශ්ව විද්‍යාලයේ සිටින බව හොඳ හැටි පෙනී ගියේය. මාර්ක්ස් වාදීන්ට විරුඬව සටනක් ඇරඹීමට ඉතා උචිත අවධිය මෙය බව දක්ෂිණාංශයට බර උදවියට කල්පනා විය. භාෂා පනත හෙළා දැකීමේ යෝජනාව තම පක්ෂයට ලැබුණු ජයක් ලෙස මාර්ක්ස් වාදීහු කල්පනා කරනත් යථා තත්ත්වය නො එසේ වන බව දුන් දුන් පැහැදිලිය

දුන් විශ්ව විද්‍යාල දේශපාලන භූමියෙහි හැප්පෙන කොටස් තුනෙකි සම සමාජ-කොමියුනිස්ට් හා-ප්‍රජාතන්ත්‍රිය සමාජ වාදීන් හැටියට හඳුන්වා ගනු ලබන දක්ෂිණාංශයට බර කොටසය. සම සමාජ-කොමියුනිස්ට් දෙ කොටස හැප්පෙන තරමට වාසි ලැබෙන්නේ තෙවන පිලටය.

ප්‍රජාතන්ත්‍රිය සමාජ වාදී සංගමය පටන් ගැනීමත් සමඟම විශ්ව විද්‍යාලය යේ දේශපාලන ඉතිහාසයෙහි වැදගත් පිටුවක් ආරම්භ විය. මාර්ක්ස් වාදය අජීර්ණ වී පවතින මාර්ක්ස් වාදීන්ගේ මහා බල කොටුව ලෙස පිළි ගැනෙන විශ්ව විද්‍යාලයේ දේශපාලනය නුදුරු අනාගතයේදී අමුතුම මඟක් ගෙන, සවරූපය අතින් වෙනස් වීමට ඉඩ කඩ ඇත් බව නම් පැහැදිලිය.

විදුදන්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ජීවිතයක ලකුණු සොයා

තිසංසලයේ හදවතට වැදී
ගලාගිය කාලයේ ගංගා
ගෙවී තිවී යත පහන් දැල්ලක එළියෙන් බලමින්
ජීවය සිඳී ගිය
පාලු බිමක
අඩ පතවූ සුළඟ වැදී
ඉබේ වැනෙන ගසක් වගේ
සුසුම් හෙලමි.

ජීවන සාරය සිඳීගොස්
ඉතිරිව ඇති කටු පඳුරු
සැපත සිඳුනු,
තටබුන් ජීවිතයක ලකුණු කීයයි.

ඇට පෑදුනු ගොන් මාල්ලෙක්
වතුර සොයා පාලු බිමේ
ගාටන්නේ මා වාගෙයි
ජීවිතයක ලකුණු සොයා.

"ලලිත"



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# சூரிய காந்தி

விடியலில் வந்து, நீ இன்முகங் காட்டியே
 விண்ணிலெ ழுந்தாயே!
நொடியினில் நோக்கி, உன் பொன்முகங் கண்டிட
 நானும் கிழ்ந்தேனே!

உளமதில் இன்பம், என் ஆருயிர்க் காதல!
 ஊன்றிடச் செய்தாயே!
இளமல ராகி, என் இன்முகங் காட்டியே
 ஈங்குநான் நின்றேனே!

முகிலிடை ஓடி, என் இன்னுயிர்க் காதல!
 மேக மளர்ந்தாயே!
பகலெலாம் உன்னையே பார்த்துக் களித்திடப்
 பாவை சுழன்றேனே!

பரிதியே நானும், உன் பக்கமே பார்த்திடப்
 பாவனை செய்தேனே!
குருதியில் ஓடி, அம் மேற்கரைக் குன்றினில்
 கோலம றைப்பாயோ?

நெருங்கிய குன்றை, நீ தேடியே நாடிடில்
 நானுயிர் வாழ்வேனோ?
கடுதியி ருந்த என் காதலின் கேதுதல்
 காதிலுங் கேளாயோ?

* * *

சி. தில்லைநாதன்.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# "சந்தேகம்"

விடுமுறை நாட்களுக்கு பிறகு முதல் சிங்கள வகுப்பு ஆரம்பிக்க இன்னும் ஐந்து நிமிஷங்கள் இருந்தன. பல மாணவ மாணவிகள் வகுப்பறைக்கு வந்துக் கொண்டே இருந்தார்கள். எந்நாளும் காணாத ஓர் உள்ளத்துடிப்புடன் நான் ஒரு நாற்காலியில் உட்கார்ந்து இருந்தேன். மாணவர்கள் அறைக்கு நுழையும் கதவைப் பார்த்தவண்ணமாய் இருந்த எனது கண்கள் ஒருத்தியினது வரவை எதிர்ப்பார்த்திருந்தன. ஏன் அவள் இன்னும் வரவில்லை? பல முறை நான் அவளைச் சந்தித்துப் பேசிய நிகழ்ச்சிகளும் காட்சிகளும் என் மனக்கண் முன்னே தோன்றலாயின.

அன்று மாலை, சர்வகலாசாலையில் எல்லா மாணவ மாணவிகளும் அழகான சாலை யோரங்களில் உலாவிக் கொண்டேயிருந்தார்கள். பல்கலைக் கழகத்தினருகே ஓர் அழகான பூந்தோட்டம். அப்பூந்தோட்டத்தைச் சுற்றி தண் புனல் 'மா மணல்' ஆறு கடல் நோக்கிச் சென்றுக் கொண்டிருந்தது. பூஞ்சோலையில் ஆற்றங்கரை யோரமாய் இருந்த கற்பாறையொன்றில் இரு மாணவிகள் மாலை நேரத்தில் செவ்வானில் படர்ந்திருந்த செங்கதிர்க்கிரணங்களைப் பார்த்துக் கொண்டிருந்தார்கள். நானும் தற்செயலாய் அப்பக்கம் வந்து கொண்டிருந்தேன். அந்த கற்பாறையில் அமர்ந்திருந்தவர்கள் என் சக மாணவிகள் என்று அறிந்தவுடனே அருகில் போய்ச் சேர்ந்தேன். அவ்விருவரும 'வாருங்கள் குமார், இப்படி உட்காருங்கள்!' என்று என்னை மனமார வரவழைத்தனர்.

அவள் மல்லிகா. நல்ல அழகி, பார்ப்பவர் கண்களுக்கு நல்விருந்தாய் இருந்தாள். நவநாகரிக முறையில் படிக்கும் பெண்களுக்கு வேண்டிய எல்லா அம்சங்களும அவளிடம் இருந்தன. பேசும் பொழுது இனிமையாகவும் குறும்புத்தனமாகவும் பேசுவாள். பல வயதுப் பெண்களிடம் காணப்படும் பொய் வெட்கம் அவளிடம் இல்லை. மற்றவளும் ஓரழகிதான், ஆனால் தானே முன்வந்து பேச நாணினாள். நான் கேட்ட சில கேள்விகளுக்கு மட்டும் பதில் அளித்தாள.

மல்லிகாவோ என்னோடு போட்டாப் போட்டியாகப் பேசத் தொடங்கினாள். மாலை நேரத்தை குறித்துப் புலவர்கள் அங்கங்கே செய்திருக்கும் பல அழகான வர்ணனைகளை எடுத்துரைத்தாள். அவள் பேச்சில் எத்துணைத் தெளிவு. எத்துணை இனிமை, பொருள் செறிவு என்றெல்லாம் நினைத்துக் கொண்டிருந்தேன். அன்று தான் மல்லிகா என் உள்ளக் கோட்டைக்குள் புகுந்தாள்.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

மல்லிகாவிடம் நான் பேசிய முதல் தடவை இதுவல்ல. இன்னொரு நாள் வகுப்பில் சிங்கள இலக்கியத்தை படிப்பித்துக் கொண்டிருந்த விரிவுரையாளர்—'மாணவிகளை விட மாணவர்கள் அலட்சியமாக இருக்கிறார்கள். வகுப்பு நடக்கும் போது கவனம் செலுத்தாமல் வேறுகாரியங்களைப் பார்ப்பார்கள்' என்று கடிந்து பேசினார். அவ்வகுப்பு முடிந்தவுடனே மல்லிகா என்னை நோக்கி மெதுவாக.

'நீங்களோ ஒரு சத்தடியுமில்லாமல் இருக்கிறீங்க! மற்ற மாணவர்களைப் போல இல்லை!' என்று என்மேல் புகழ்மாலையைச் சூடினாள். அதற்கு பிறகு ஒரு நாள் சர்வகலாசாலைத் சிங்கள இலகிய சங்கத்தின் ஆதரவில் 'சொற்பொழிவுப் போட்டி' ஒன்று நடாத்தப்பட்டது. அதில் நான் முதலிடம் பெற்றேன். போட்டி முடியதும் முடியாததுமாக என்னைத் தேடி வந்து நன்றி செலுத்தி விட்டுப் போய்விட்டாள்' இப்படிப் பல சம்பவங்கள் நம்மிருவர் உள்ளங்களை இணைக்கும் செயலில் ஈடுபட்டிருந்தன.

பல தடவைகளில் மல்லிகா தன் ஊரைப் பார்க்க வர வேண்டுமென்று என்னிடம் கேட்டுக் கொண்டிருந்தாள். நானும் "பிறகு பார்ப்போம்" என்று சாக்குச் சொல்லியிருந்தேன். இந்த நம்பிக்கை இப்படி வளர்த்துக் கொண்டேயிருக்க, என்னைப் பிரிந்து ஊரில் இத்தனை நாள் கழிந்து வந்த மல்லிகாவைப் பார்க்கவும் அவள் குறுநகைதேன் மொழிகளில் இன்பத்தை அனுபவிக்கவும் வெகு ஆவலாய்க் கதவைப் பார்த்துக்கொண்டே இருந்தேன்.

அவள் வந்தாள! வகுப்பு அறைக்குள் நுழைந்தாள். என்னைக் கண்டதும் காணாதவள் போல வந்து உட்கார்ந்தாள்! முன்பிருந்த இன்முகம் எங்கே? இளநகை எங்கே? இன்சொல் எங்கே? என்று பல கேள்விகள் என்னுள்ளத்தில் எழுந்தன.

'இது என்ன விந்தை ஆயிற்றே? என்று முணு முணுத்தேன். மல்லிகாவின் இத்திடீர் மாற்றத்தைக் கண்ட நான் மன வருத்தமடைந்தேன். நான் என்ன பிழை செய்தேன்? என்ன சொல் தவறிவிட்டுப் பேசினேன்? என்றெல்லாம் சிந்தித்துக் கொண்டிருக்கையில் என் அருமைத் தோழன் மூர்த்தி அங்கு வந்து சேர்ந்தான். இந்தத் தொடர்புத் தொடங்கிய முதல் நாளிலே இருந்து இதுவரை எல்லாவற்றையும் அவனிடம் சொல்லியிருந்தேன். அவனிடம் சொல்லாத இரகசியமே இல்லை. அன்று நிகழ்ந்த இவ்விபரீதமான சம்பவத்தையும் தெரிவிக்கலானேன். மூர்த்தியும் மன வருத்தமடைந்தான். தன் தோழனுடைய இன்பத்தைக் கொள்ளையடிக்க எந்த சனியன் அவள் முன் தோன்றி



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

யிருக்கிறதோ என்று ஐயமுற்றான். சில மணி நேரம் மூர்த்தியும் நானும் இவ்விஷயத்தைப் பற்றிப் பேசினோம் கடைசியில் மூர்த்தி:

'இது பெண்களுடைய இயல்பே, அவள் மனம் சலியாதிருக்காது. அதுவும் நவநாகரிக முறை தழுவிச் சர்வகலாசாலைகளில் படிக்கும் பெண்களைப் பற்றி வேறு சொல்ல வேண்டுமா? பல மாயா தந்திரங்களைக் காட்டி ஆண்களை மயக்கிவிடுவார்கள். பிறகு 'வேண்டாம்' என்ற நினைவு வந்தவுடன் ஒதுக்கி வைப்பார்கள்! இது அவர் சுபாவம்! அவளைப் பற்றி வருந்தாதே! அடியோடு மறந்துவிடு!

என்று சமாதானம் சொல்லிப்பார்த்தான். ஆனால் எனக்கு மல்லிகாவிடம் அபார நம்பிக்கை. அவள் அப்படிபட்டவள் அல்ல என்பதைத் திடமாக நம்பினேன். தனியாய் சந்தித்து இதைப்பற்றி அவளிடம் பேச வேண்டும் என்று ஆவலாய் இருந்தேன்.

அன்று பின்னேரம். வகுப்புக்கு வந்திருந்தேன். வகுப்பு அறைக்குப் போகும் வழியில் மூர்த்தியை சந்தித்தேன்.

'அந்த கடிதம் எங்கே?' என்று மூர்த்தி என்னிடம கேட்டான். அப்போது தான் எனக்கு ஞாபகம் வந்தது. ஒரு மாதத்துக்கு முந்தி ஒரு நாள் மூர்த்தி தன் மாமாவின் பெண் தன்னிடம் எழுதிய கடிதமொன்றை என்னிடம் காட்டினான். நான் அதை பலவந்தமாக எடுத்து வைத்துக் கொண்டேன். அக்கடிதத்தில் அவள் மூர்த்தியிடம் தனது நிலையான அன்பைப் பற்றி பலவாறு எழுதியிருந்தாள். 'அத்தான்' என்ற சொல்லைத் தவிர மூர்த்தியின் பெயரை அங்கே குறிப்பிட்டிருந்ததைக் கண்டேனல்லேன்.

இப்பொழுது அக்கடிதம் எங்கே யென்று என் புத்திக்குப் புலப்படவில்லை. அதை நாளை கொண்டு வருவேன் என்று மூர்த்தியிடம் சொல்லி என் விடுதிக்கு வந்து தேடலானேன், அது அகப்பட வில்லை.

அப்பொழுது, ஒரு நாள் மல்லிகாவிடமிருந்து அவளுடைய இராமாயணத்தை நான் கொண்டுவந்திருந்தமை ஞாபகத்துக்கு வந்தது. அக்கடிதத்தை அதன் பக்கங்களினூடே போட்டதையும் அப்புறம் தெரிந்துக் கொண்டேன், அக்கணமே, மல்லிகாவின் மன மாற்றத்துக்கு காரணம் என்னவென் பதை வெள்ளிடைமலையாக எனக்குப்பட்டது. எல்லாம் அந்த கடிதம் செய்த திருவிளையாடலே.

**வி. வச்சிரசேனன்.**



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# புலவனுரைத்த அரசியலறம்.

"கலைஞர்கள் அரசியலிலே தலையிடக் கூடாது. அவர்கள் அரசியலிலே தலையிடுவது நாட்டுக்கு நல்லதல்ல" என்று சிலர் இன்று சொல்லக் கேட்கிறோம். அரசியற் காரியங்களில் ஆசிரியர் மாணவர், நடிகர், புலவர் யாருமே கலந்து கொள்ளக் கூடாது என்பது இவர்கள் கருத்து. பின்பு யார்தான் அரசியலில் கலந்து கொள்வதென்றால் 'அரசியல் வாதிகளே' என்பர் இவர். யாரந்த அரசியல் வாதிகளோ யாமறியோம். ஆனால் ஒன்றுமட்டும் நாம் மறுக்கமுடியாது. நாட்டின் அரசியல் நாட்டோர் எல்லோரை யும் பாதிக்கவே செய்யும். நாம் அதை விட்டு ஓட முனைந்தாலும் அது எம்மை விடாது. நாட்டின் நலன் நோக்கும் எவரும் அர சியல் பிழைத்தபோது அறங்கூறவும் முயல்வது இயல்பு. இது பண்டைக்காலமுதல் நாம் கண்டுவரும் உண்மை. பண்டைய தமிழ் அரசர் அறநெறிபிழைத்தபோது நம்மகத்துப்புலவர் அவர்முன்னர்ச் சென்று அஞ்சா நெஞ்சுடன் தவறை இடித்து ரைத்து நல்லறங்கூறியதை நாமறிவோம். வேந்தரும் அவரை மதித்தே நடந்தனர்.

அரசர் பிழைத்த போது மட்டுமன்றி, முன் எச்சரிக்கை யாகவுங்கூட அவர்கள் வேந்தர்க்கு விழிதிறந்து வைத்ததுண்டு. சோழன் குளமுற்றத்துத் துஞ்சிய கிள்ளிவளவன் அரசோச்சிக் கொண்டிருந்த காலமது. நாடு செல்வச் சிறப்புடனும் வெற்றிக் களிப்புடனும் குதூகலத்தில் ஆழ்ந்திருந்தது. அந்நிலையில் அரசன் பெருமையைப் புகழ்ந்து:

"முரசு முழங்கு தானை மூவர் உள்ளும்
அரசு எனப்படுவது நினதே பெரும!" என்றுகூறிய வெள்ளைக் குடி நாகனார் என்னும் தமிழ்ப்புலவர் அந்த அரசனு க்கு அரசியலறமும் சில உரைக்கிறார். அவர் அது உரைப்பது அவன் அரசியல் பிழைத்ததினாலல்ல. அவன் என்றும் பிழையா மல் இருக்கவேண்டுமென்ற எண்ணத்தால். நாட்டின் நலனே தன் நலனாகக் கருதும் நல்வேந்தன் இச்சோழன். நாட்டின் செல் வச்சிறப்பினாலே தான் பெருமை பெறும் இவ்வேந்தனை விழித் துப் புலவர் சில புத்திமதிகள் கூறுகிறார்.

"காட்சிக்கு எளியன் கடுஞ்சொல்லன் அல்லனேல்
மீக்கூறும் மன்னன் நிலம்" என்றார் வள்ளுவர். சில ஆட்சியாளர் தாம் மக்களை விட உயர்ந்தவர் என்ற தற்பெரு மையினால் மக்களின் அன்புத்தொடர்பை இழந்திருப்பர். மக்க



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ளின் துன்பமோ தேவையோ அறியாது நடாத்தப்படும் அவரது ஆட்சியில் அறம் நிலவாது. அரசனுக்குத் தமது குறையுணர்த்தும் சுதந்திர மின்றி மக்கள் துன்புறுவர். அவர்கள் கீழுள்ள துணையாளரை முற்றும் நம்பியிருக்கமுடியாது. அவர்கள் நாட்டு நிலையை அரசன் அறியாது திரையிட்டு தம் நலன் நாடி நடந்திடவுங் கூடும். ஆட்சியிலே மக்கள் குறையிரக்கும் போது மற்றவர் அதை நிவர்த்தி செய்வதற்குப் பதில் அரசனே நேரில் காட்சி தந்து அதைத் தீர்த்தால் மக்கள் அளவிலா ஆனந்தமடைவர். அம்மன்னனிடம் அவரது அன்பு பன்மடங்கு பெருகும். ஆட்சியாளர் நல்லாட்சி நடாத்தத் தவறிய போதிலும் மக்களுடன் தாம் சமமாகக் கலந்து பழகுவது போலச் சில சந்தர்ப்பங்களிலாவது காட்டிச் செல்வாக்குத் திரட்டுவதை நாம் காணலாம். மழைத்துளியை வேண்டுவோர் பெருமழையே பெய்தால் எப்படி உள்ளக்களிப்படைவரோ அப்படியே ஒருவர் நீதி வேண்டும் போது அவருக்கு மன்னவனே எளிதில் காட்சிதருவானுகில் அவர் பெருமகிழ்ச்சி அடைவர், என்று சோழவேந்தனுக்குப் புலவர் கூறுகிறுர்.

நாம் சாதாரணக் குடைகளைப் பாவிப்பது வெயிலுக்கும் மழைக்கும். அரசனுக்கும் வெண்கொற்றக் குடையுண்டு. ஆனல் அது வெயிலுர்காகப் பிடிக்கப்படுவதல்ல. அரசன் குடிகளின் நலன் மறந்து கொடுங்கோல் நடாத்துவானுயின் அவனது வெண்கொற்றக்குடை வெறும் வெயிலுக்குப் பிடிக்கும் குடையாகிவிடும். அதையே, "கூரிய வேலேந்தும் வளவனே! உன் வெண்கொற்றக்குடை வெயிலை மறைக்க உள்ளதல்ல; அது குடிகளின் துன்பந் துடைத்து அருள் புரிவதன் சின்னம்" என்று புலவன் கூறுகிறுன். இந்த அறிவுரையில் எத்துணைபொருள் பொதிந்துகிடக்கிறது? வெயிலை மறைக்கும் குடை அதை உடையவனை வெயிலினின்றும காக்கும். ஆனல் வெண்கொற்றக் குடையோ, அதாவது ஆட்சிபீடம் ஒருநாட்டின் மக்கட் கூட்டத்தையே துன்பமணுகாமல் காக்கவேண்டியது. இவ்விரு குடைகளுக்கிடையேயும எவ்வளவு வேறுபாடு?. மக்களின் நல் வாழ்வு அரசரின் ஆட்சி நலனிலேயே தங்கியிருக்கும்.

"வான் நோக்கி வாழும் உலகெல்லாம்: மன்னவன்
கோல் நோக்கி வாழுங் குடி" என்றுர் வள்ளுவர்.

நாட்டை ஆட்சி புரிவோன் மக்களைத் துன்புறுமல் காக்கவேண்டும். அதற்குத்தான் அவன் ஆட்சிபுரிகிறுனேயன்றித் தன்னைக் காக்கவல்ல. "ஆட்சிபீடத்தில் தமது நிலையை என்றும் காப்பதிலேயே கண்ணுங் கருத்துமாய் இருந்து கொண்டு நாட்டு மக்



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

களைத் துன்பப் படுகுழியிலே தள்ளுவோர் எப்படி ஆட்சிபீடத்திலிருக்கத் தகுதியுடையவராவர்?'' என்று இன்று நாம் எழுப்பும் கடாவைப் புலவன் 2000 ஆண்டுகளுக்கு முன்னமேயே எழுப்பியிருக்கிறன்.

பகைவர்கள் பெரும்படையுடன் வந்து இச்சோழமன்னனுடன் போரிட்டபோது இவனே பெருவெற்றியடைந்தான். இந்த வீரப் புகழ்மிகு வேந்தன் வெற்றிக் களிப்பிலே விபரீத வழிச் செல்லக் கூடுமெனப் புலவன் பயந்தானே?. அரசனுக்கு அவ்வெற்றி தேடித்தந்தது அவனது வீரர்களே என்று நினைவூட்டுகிறன் தற்பெருமையால் வேந்தன் அது வெற்றி என்று கருதுவானேயாகில் அது முழுதும் தவறு. அரசன் வீரமுடையவனுக இருந்தால் மட்டும் போதாது. அவன் வெற்றிக்குக் குடிமக்களின் ஒத்துழைப்பு என்றென்றும் வேண்டும் வீரர் தமது பணியைவிரும்பிச் செய்ய வேண்டும். அந்த வீரங்கூட வெறும் பேச்சால் பிறந்து விடாது. அதிகார ஆணையால் வீரம் வராது. வீரரின் தேவை தீர்க்கப்பட வேண்டும் அவர்கள் துன்பமின்றி இருக்கவேண்டும். வாழ்விற்கு முக்கியமான உணவு வீரர்க்கும் வேண்டும். அந்த உணவை உழவரே அளிப்பார். அவ்வுணவின்றேல் வீரர் பணியில்லை. அப்பணியின்றேல் வேந்தனுக்கு வெற்றியில்லை. ஆகவேதான் அரசனுக்குக்கிடைத்த வெற்றி வயலில் விளைந்த நெல்லின் பயன் என்பதை மறக்கவேண்டாமெனப் புலவன் எச்சரிக்கிறன்.

''உழவார் உலகத் தார்க்கு ஆணி அஃது ஆற்ருது
எழுவாரை எல்லாம் பொறுத்து'' என்ற வள்ளுவர் கருத்தையே ஈங்கு வெள்ளைக்குடி நாகனரும் கொண்டுள்ளார்.

நாட்டில் மழையில்லையாயினும் விளைவு குறைந்தாலும் மக்கள் ஆட்சி புரிவோனையே பழிப்பர். நாட்டிற் கொடுமை நிலவும்போது ''இவனென்றைக்கு ஆட்சிக்கு வந்தானே அன்று முதல் தொல்லை'' என்று இக்காலத்தும் மக்கள் ஏசுவதைக்காணலாம். ஆனல் ஆட்சியாளர் மக்கள் நலனிலே கண்ணுய் நல்லதே செய்துவரும்போது, அவர் சில தவறிழைத்த போதிலும் அவருக்காக மக்கள் பரிந்தேபேசும் மனநிலையுடையவர் என்பதையும் நாம் மறக்கலாகாது.

''இயல் புளிக் கோலோச்சும் மன்னவன் நாட்ட
பெயலும் விளையுளும் தொக்கு'' எனுங்குறளால், நீதி தவருத மன்னவன் நாட்டிற் பருவ மழையும் விளைவும் ஒருசேர ஏற்படுமென்றும்:



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"முறை கோடி மன்னவன் செய்யின் உறைகோடி
ஒல்லாது வானம் பெயல்" என்ற குறளால் அரசன் நீதி முறை தவறினல் பருவமழையும் தவறும் என்றும் வள்ளுவர் கூறுகிறார். வெள்ளைக் குடி நாகனாரும் 'வானம் பொய்ப்பினும் விளைவு குன்றினும் மக்கள் உன்னையே பழிப்பர்' என்று சோழ வேந்தனைப்பார்த்துக் கூறுகிறார்.

அப்படிப் பழிக்கப்படாமல் மக்களின் நல்லெண்ணத்தைப் பெற வழியும் கூறுகிறார் புலவர். மாறுபட்டவரின் பொது மொழியை மனதிலே கொள்ளாமல் உழவரைப் பாதுகாத்து அதன் மூலம் ஏனைக்குடியினரையும் பாதுகாக்கும்படி கூறுகிறார். உழவுத் தொழில் சிறப்புற்றால் ஏனையோரும் வாழவழியுண்டு. வரம்புயரக் குடியுயரும். அதனாலே கோனும் உயரும். உழவுத் தொழிலை வாயால் வெறுமனே புகழ்வதாலோ அல்லது உழவரை வேண்டிக்கொள்வதாலோ, கட்டளையிடுவதாலோ நெல்லு விளைவிக்க முடியாது. உழவருக்கு வேண்டிய உதவிசெய்து, ஊக்கந்தந்து நல்ல சூழ்நிலையளித்து விளைவைப் பெருக்கவேண்டும். அவர்களுக்கு நம்பிக்கையும் பாதுகாப்பும் இருக்க வேண்டும்.

"முறை செய்து காப்பாற்றும் மன்னன் மக்கட்கு இறை என்று வைக்கப்படும்" என்று வள்ளுவர் சொல்வதுபோல வேந்தன் போற்றப்பட வேண்டுமானல் அவன் குடிகளுக்குத் தகுந்த உதவிசெய்து அவர்களைக் காப்பாற்ற வேண்டியது அவசியம்.

அரசனது ஆரசனைக்கு உட்படாத வரும் அவனது அடிபோற்றுவர் என்று புலவன் சோழவேந்தனுக்கு எடுத்துரைக்கிறன். உண்மை தானே!. மக்களை முறை செய்து காக்கும் மன்னனை யார்தான் போற்றுதிருப்பர்?

"குடி தழீஇக் கோலோச்சும் மாநில மன்னன்
அடி தழீஇ நிற்கும் உலகு" என்கிறார் வள்ளுவர். குடிகளை அன்போடு அணைத்துக் கோலோச்சும் மன்னவன் அடியினை உலகமே அணைத்துக் கொள்ளும் எனின் அவன் அன்புக்கு அடங்காதவரும் இருப்பரோ? இப்புலவன் கூறும் வழியே ஆட்சி புரிந்தால் போரும் தேவைப்படுமோ? பூசலும் ஏற்படுமோ? சோழன் குளமுற்றத்துத் துஞ்சிய கிள்ளிவளவனைப்பார்த்து வெள்ளைக்குடி நாகனார் பாடிய இச் செய்யுள் (புறம் 35) இன்றைய அரசியலாருக்கும் அறங்கூறுந்தன்மைத்து.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"நாடு கெழு செல்வத்துப் பீடு கெழு வேந்தே
நினவ கூறுவல் எனவ கேண்மதி;
அறம்புரிந்தன்ன செங்கோல் நாட்டத்து
முறை வேண்டு பொழுதின் பதன் எளியோர் ஈண்டு
உறை வேண்டு பொழுதில் பெயல் பெற்றோரே!
ஞாயிறு சுமந்த கோடுதிரண் கொண்மூ
மாக விசும்பின் நடுவுநின்றாங்குக்
கண்பொர விளங்கும் நின் விண்பொரு வியன் குடை
வெயில் மறைக் கொண் டன்றோ அன்றே வருந்திய
குடிமறைப்பதுவே கூர்வேல் வளவ!
வெளிற்றுப் பனந் துணியின் வீற்று வீற்றுக் கிடப்பக்
களிற்றுக் கணம் பொருத கண்ணகன் பறந்தலை
வருபடை தாங்கிப் பெயர்புறத் தார்த்துப்
பொருப்படை தரூஉங் கொற்றமும் உழுபடை
ஊன்றுசால் மருங்கின் ஈன்றதன் பயனே!
மாரி பொய்ப்பினும் வாரி குன்றினும்
இயற்கை யல்லன செயற்கையில் தோன்றினும்
காவலர்ப் பழிக்கும்இக் கண்ணகன் ஞாலம்
அது நற்கு அறிந்தனையாயின், நீயும்
நொதுமலாளர் பொதுமொழி கொள்ளாது
பகடு புறம் தருநர் பாரம் ஓம்பிக்
குடிபுறம் தருகுவை யாயினின்
அடிபுறம் தருகுவர் அடங்காதோரே"

சி. தில்லைநாதன்.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## *Acknowledgements*

*We wish to thank all those who made contributions to this Magazine and others who extended their help in many other ways. We regret that owing to lack of space and other reasons some of the contributions could not be published.*

*We regret that in spite of the many attempts made by the Editor, a representative number of Tamil articles could not be published.*


# Character

Institutions and organisations depend on their reputation and character. Reputation may bring immediate success, but character decides their ultimate end.

Character means unswerving loyalty to high ideals—a magnanimity that seeks the spirit of the contract rather than its letter, above every thing else a consistent desire to give fair-plan.

Reputation is what others think of us and character is what we really are. It is the anvil on which are forged links of abiding friendship.

**The Ceylon Insurance Co., Ltd.**

**69, Queen Street,** **COLOMBO.**


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*Mallika's*

***for better***

Photographs
Out-Door Groups
Snap-Shots
Re-productions

***Plus***

Photo-Goods
of
Any kind

(just opposite the Police Station)

*Dial*—**7065**

**MALLIKA STUDIO**
**KANDY**

For - -

**SAREES**

to please your eye
and last long

***VISIT*** - -

**ANULA STORES**
**39, Badulla Road,**
**WELIMADA.**

**THE HOME UNIVERSITY LIBRARY**

**History of England 1815—1918** *J. R. M. Butler*
**Political Thought in England—Bacon to Halifax** *G. P. Gooch*
**India, Pakistan and the West** *Percival Spear*
**The English Reformation to 1558** *T. M. Parker*
**Medieval Europe** *H. W. C. Davis*
**Medieval England** *Sir Maurice Powicke*
**Karl Marx** *Isaiah Berlin*
**The English Revolution, 1688—1689** *G. M. Trevelyan*
**World History from 1914 to 1950** *David Thomson*

**Rs. 6-40 each**

**LAKE HOUSE BOOKSHOP**

P. O. Box 244, 100, Parsons Road, Colombo 2.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*Printed at the*
GAMINI PRINTERS
AND
BOOK DEPOT
KANDY

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org